# ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය

# 2012

## වාර්ෂික කාර්යසාධන වාර්තාව
## (2012.01.01 - 2012.12.31 දක්වා)

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
අංක 80/ 5, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.



## මහින්ද චින්තන ඉදිරි දැක්ම . . .

- 2001 – 2004 රජයෙන් ගොඩ කිරීමට ක්‍රියා කළ කුඹුරු ඉඩම් "පුරන් කුඹුරු අස්වැද්දූම" යටතේ නැවත වගා කිරීම ආරම්භ කර ඇත. ඒ යටතේ දැනටමත් අක්කර 150,000ක් අස්වද්දා ඇති අතර තවත් අක්කර 150,000ක් නැවත අස්වැද්දීමට ඉලක්ක කරමි.
- දැනට රජය මගින් රුපියල් 350 ට ලබාදෙන පොහොර මල්ලක් සෑම ගොවියෙකුටම විවෘත වෙළඳ පොළෙන් ලබා ගත හැකි වන පරිදි පොහොර සහනාධාරය බෙදා හැරීම වෙනස් කෙරේ. ඒ අනුව දැනට පොහොර බෙදා හැරීමේදී ඇතිවන අක්‍රමිකතා අවසන් කළ හැකිය. එපමණක් නොව සෑම ගොවියෙකුටම දැනට වී සහ එළවළුවලට පමණක් සීමාවී ඇති පොහොර සහනාධාර ක්‍රමය අනෙකුත් බෝගවලට ද රුපියල් 350 ට ලබාගත හැකි වන සේ ප්‍රතිසංවිධානය කරමි.
- ලංකාවේ අද ගොවීන්ගේ ඉදිරි පරම්පරාවන් මුහුණ දී සිටින අවිනිශ්චිතතාවන් සඳහා තිරසාර විසඳුමක් සැපයිය යුතු බව මගේ විශ්වාසයයි. ඒ සඳහා අවශ්‍ය නීති රීති නොපමාව සකස් කරමි.
- කාබනික පොහොර භාවිතය සහ නිෂ්පාදනය තවදුරටත් දිරිගන්වමි.
- පොහොර සහ රසායනික දියර භාවිතය පරිසර හිතකාමී අයුරින් සිදුකිරීමට අවශ්‍ය නීති රාමුව ශක්තිමත් කරමි.
- ගොවි බැංකු ක්‍රමය තවදුරටත් ශක්තිමත් කර ගොවියාට අවශ්‍ය සියලු ණය ගොවි බැංකු ක්‍රමය මගින් ලබාදීමට කටයුතු කරමි.
- වී සහ අනෙකුත් ආහාර බෝග අවාරයේදී වෙළඳ පොළට නිකුත් කිරීමේ වාසිය ගොවියාටම ලබා දීම සඳහා ගෘහ මට්ටමෙන් කුඩා ගබඩා සකස් කිරීමේ වැඩපිළිවෙලක් ගොවි මහතුන්ට හඳුන්වා දෙමි.
- පසුගිය දශක කීපයක අවිධිමත් සංවර්ධනය හා ත්‍රස්තවාදය විසින් අපේ ජාතික වනෝද්‍යාන ගිල ගැනීම නිසා අලි ඇතුන් ගම් වැදී අලි මිනිස් ගැටුම නිර්මාණය විය. මේ සඳහා පිළියමක් ලෙස 2009 දී ගජමිතුරෝ වැඩසටහන ක්‍රියාත්මක කළෙමි. එමගින් අලි පාලන ඒකක පිහිටුවීම හා අලි වැට ඉදිකිරීම වේගවත් කළ අතර පසුගිය වසර දෙක තුළ පමණක් විදුලි වැට කිලෝ මීටර් 600ක් ඉදිකිරීම හා නවීකරණය සිදු කළෙමි. උතුරු නැගෙනහිර ද ඇතුළුව මෙම ගැටළුවට මුහුණ පාන සියළු ගම්මාන වල විදුලි වැට ඉදිරි වසර තුනේදී අවසන් කරමි.
- ත්‍රස්තවාදය නිසා වැසී ගිය විල්පත්තු, කුමන, යාන්ඔය, චුන්ඩිකුලම ආදී සියළු වන උද්‍යාන නවීකරණය කර ඉදිරි වසර තුළ විවෘත කරමි.
- වඳවී යන සත්ත්ව විශේෂ ආරක්ෂා කිරීමත්, පරිසර සංරක්ෂණය වැඩිදියුණු කිරීමත් සඳහා රුපියල් මිලියන 2,600ක් වැය වන නව ව්‍යාපෘතියක් 2010 සිට ක්‍රියාත්මක කරමි.

**මහින්ද රාජපක්ෂ**

**ගොවිජන සේවා හා වනජීවී අමාත්‍ය**



## ශක්තිමත් ජාතික ආර්ථිකයක් කරා . . . . . .

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ 2012 කාර්යසාධන වාර්තාව නිකුත් කිරීම වෙනුවෙන් සුභ පැතුම් පණිවුඩයක් එක් කරනුයේ හද පිරි සතුටිනි.

ශක්තිමත් ජාතික ආර්ථිකයක් බිහිකරළීමේ වැඩ පිළිවෙලෙහිදී කෘෂිකර්මාන්තයට හිමිවන්නේ සුවිශේෂී තැනකි. අතීතයේ සිටම ස්වයංපෝෂිත කෘෂි අර්ථක්‍රමයකට උරුමකම් කියූ අප මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අරමුණු හා ඉලක්ක මල්ඵල ගැන්වීම සඳහා සුවිශේෂී වැඩසටහන් රාශියක් මේ වසර තුළ ක්‍රියාත්මක කරන ලදී. දිවයිනේ ප්‍රදේශ රාශියක පුරන්කුඹුරු අස්වැද්දීම සහ පොහොර සහනාධාර වැඩසටහන නොකඩවා ක්‍රියාත්මක කිරීම තුළින් කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවිජනතාව දිරිමත් කරමින් ජාතික වී නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් ලෝකයට සහල් සපයන්නන් අතරට අප රටද එක් කිරීමට හැකිවීම අප ලැබූ විශාල ජයග්‍රහණයකි. එසේම අනෙකුත් බෝග සඳහාද පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම, ආහාර වලින් රට ස්වයංපෝෂිත කිරීම සඳහා දායකවීමට හැකි වී තිබීම ද අප ලැබූ ජයග්‍රහණක් ලෙස සඳහන් කළ හැකිය. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලැබෙන ප්‍රතිපාදන මගින් සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ හා වැව් ගැඹුරු කිරීම ක්‍රියාත්මක කිරීම කාර්යක්ෂම ජල කළමනාකරණයක් පවත්වා ගනිමින් ප්‍රධාන කෘෂි නිෂ්පාදනයන් හා අනෙකුත් බෝග වගා කිරීම සඳහා අවශ්‍ය ජල පහසුකම් ලබාදීමටත් අමාත්‍යාංශයට හැකිවී ඇත.

රටේ ජාතික නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමට දායකවන අතරම වනජීවී සංරක්ෂණ කටයුතු සිදු කිරීමෙන් ජෛව විවිධත්වයේ සමතුලිතතාවය රැක ගනිමින් අලි මිනිස් ගැටුම අවම කිරීමටද, වන සතුන්ගෙන් ගොවිජනතාවට ගොවි බිම්වලට හා දේපළ වලට වන හානිය අවම කිරීම අප අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයකි. දේශීය විදේශීය සංචාරකයින් ආකර්ෂණය කරමින් ඉහළ ආදායමක් උත්පාදනය කරගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ගජමිතුරෝ වැඩසටහන, හොරොව්පතාන හා ලුණුගම්වෙහෙර වන අලි රැඳවුම් මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම, විල්පත්තු ඇතුළු ජාතික වනෝද්‍යාන සංවර්ධනය කිරීම ඇතුළු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

අප හමුවේ ඇති අභියෝග ජය ගැනීමට නිරන්තරව උපදෙස් හා නායකත්වය සපයන අතිගරු ජනාධිපතිතුමාට, අමාත්‍යාංශය නිවැරදි මගට යොමු කරමින් අවශ්‍ය මගපෙන්වීම් කරනු ලබන ලේකම් තුමාට, අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට, අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල කාර්යය මණ්ඩලවලට හා මෙම කාර්යය ඉටු කිරීමට දායක වූ සියලු නිලධාරීන්ට මාගේ කෘතඥතාව පළ කරමි.

**එස්.එම්.චන්ද්‍රසේන**

**ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය අමාත්‍ය**

## ලේකම්තුමාගෙන් . . . . . .



සමස්ත ලෝකයම ආහාර සුරක්ෂිතතාවය සඳහා වූ වැඩපිළිවෙල තම න්‍යාය පත්‍රයෙහි අංක එක බවට පත්කොටගෙන ඇති සුවිශේෂී කාල පරිච්ඡේදයක කෘෂිකර්මාන්තයට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී කෘෂිකාර්මික අංශයේ ඉලක්ක සපුරා ගැනීමට ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය ඉහළ දායකත්වයක් ලබාදෙයි.

පුරන් කුඹුරු අස්වැද්දුම යටතේ ශ්‍රී ලංකාව පුරා සිටින ගොවිජනතාවට වී නිෂ්පාදන ධාරිතාව ඉහළ නංවාලීම තුළින් වෙළඳපළ ආර්ථිකය තුළ ඉහළ නිෂ්පාදන ධාරිතාවක් සැපයීමට හැකිවී තිබේ. ගොවිජන සේවා මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම හා නව ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදිකිරීමෙන් හා ගොවි බැංකු ක්‍රමය තවදුරටත් ශක්තිමත් කර ගොවිජනතාවගේ අනාගත ස්ථාවරත්වය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතීන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කර ඇත. ලෝක වෙළඳපොළේ පොහොර මිටියක් රුපියල් 9000කට අධික මිලක් පවතිද්දීත් ගොවිජනතාවට පොහොර සහනාධාරය ලබාදීමේ වැඩපිළිවෙළ ජාතික පොහොර ලේකම් කාර්යාලය මඟින් දිවයින පුරා විහිදී පවත්නා ගොවිජන මධ්‍යස්ථාන 557 මගින් අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් පවතී. එමෙන්ම අතිරේක බෝග සඳහාද මේ වසරේ සිට පොහොර සහනාධාරය ලබාදෙමින් ගොවීන් ශක්තිමත් කිරීමේ වැඩපිළිවෙළ තවදුරටත් සිදුකරමින් පවතී. සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය හා වැව් ගැඹුරු කිරීම තුළින් ඉහළ වාරි කළමනාකරණයක් පවත්වා ගනිමින් වර්ෂය පුරා කෘෂිකාර්මික නිෂ්පාදනයන්ට අවශ්‍ය ජල සැපයුම් මගින් කෘෂි නිෂ්පාදන ධාරිතාව සමබරව පවත්වා ගැනීමටත් සමස්ත ආර්ථිකය ශක්තිමත් කිරීමට ඉහළ දායකත්වයක් ලබා දීමටත් අපට හැකිවී ඇත.

ජෛව විවිධත්වය අතින් ලෝකයේ ඉහළම රටවල් 25 අතර රැඳී සිටීමට හැකි වී ඇති අප රටේ ලොව අන් රටවල් අබිභවන සොබා සම්පතින් අලංකාර වූ රටකි. ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 14% ක වගකීම හිමිවී ඇති වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හඬක් නැගිය නොහැකි සතුන්ගේ හිමිකම් වෙනුවෙන් පෙනීසිටින ආයතනයකි.

අලි මිනිස් ගැටුම අවම කරමින් වන සතුන්ගෙන් ගොවිබිම් හා දේපළ වලට වන හානිය අවම කිරීම, සඳහා 2006 වර්ෂයේදී සකසන ලද ශ්‍රී ලංකාවේ වන අලි සංරක්ෂණය හා කළමනාකරණය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය මගින් ජාතික හා ජාත්‍යන්තර නීති රෙගුලාසි වලට අනුකූලව ජෛව විවිධත්වය සුරකෙන අයුරින් වනජීවී උරුමයන් සංරක්ෂණය කිරීම, ගජමිතුරෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අලිපාලන ඒකක පිහිටුවීම, නවීණ විදුලිවැටවල් ඉදිකිරිම මගින් සුවිශේෂී මෙහෙවරක යෙදෙමින් සිටියි.

ජාතික වනෝද්‍යාන සංවර්ධනය කිරීම හා වැඩි දියුණු කිරීම මගින් සංචාරකයින්ගේ පැමිණීම වර්ධනය වීමෙන් විදේශ විනිමය ඉහළ නංවා ගැනීමට හැකිවී ඇත.

ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යමත් රටක් බවට පත්කිරීමේ ජාතික තේමාවට මෙම අමාත්‍යාංශයේ දායකත්වය ඉහළ මට්ටමින් ලබාදීම සඳහා අමාත්‍යාංශයේ කටයුතු සාර්ථකව ඉටුකිරීමේදි නිරන්තරෙයෙන් මග පෙන්වමින් නායකත්වය හා උපදේශකත්වය ලබාදුන් ගොවිජන සේවා හා වනජීවී අමාත්‍ය අතිගරු ජනාධිපතිතුමාට හා නියෝජ්‍ය අමාත්‍ය එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමාට මාගේ හෘදයංගම ස්තුතිය පුදකරන අතර අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලයට හා ඊට අනුබද්ධිත ආයතන වල නිලධාරින්ටද ස්තුතිය පුදකරන අතර මෙම ග්‍රන්ථය සැකසීමේ කටයුතු වල නියැලුණු නිලධාරින්ට ද අවශ්‍ය දත්ත හා තොරතුරු ලබාදුන් නිලධාරීන්ට හා පරිවර්තන කටයුතු කරදුන් නිලධාරීන්ටත් මාගේ ස්තුතිය පුදකරමි.

**ඉංජි. උදේනි වික්‍රමසිංහ**

**ලේකම්**

# පටුන

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය 11

සංවර්ධන අංශය 13

පාලන අංශය 20

ගිණුම් අංශය 23

අභ්‍යන්තර විගණන අංශය 25

විමර්ශන අංශය 26

නීති අංශය 27

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව 29

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව 41

ජාතික පොහොර ලේකම් කාර්යාලය 55

සී/ස. ලංකා පොහොර සමාගම 65

සී/ස. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම 77

සී/ස. ජනතා පොහොර ව්‍යවසාය 83

ශ්‍රී ලංකා වනජීවී භාරය 87

# ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය

## දැක්ම

" ඵලදායී කෘෂි ඉඩම් වගාව, සමෘද්ධිමත් ගොවි ප්‍රජාවක් හා වනජීවී උරුමයන් සංරක්ෂණය "


## මෙහෙවර

" කාර්යක්ෂම වෘත්තීය කළමනාකරණයක් පවත්වා ගනිමින් සියල්ලන්ම හා එක්ව ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා කෘෂි ඉඩම්වල උපරිම ඵලදායීතාවය ලබා ගැනීමට ගුණාත්මක කෘෂි සේවාවන් ලබාදීම, කාර්යක්ෂම වාරි කළමනාකරණය හා ගොවි ප්‍රජාවගේ සංවිධාන ශක්තිය වැඩිදියුණු කිරීම තුළින් කෘෂිකර්මාන්තයට ගොවීන් පෙළඹවීම සඳහාද, ඵලදායී වනජීවී රක්ෂිත ජාලයක් පවත්වා ගෙනයාම තුළින් ජෛව විවිධත්ව සංරක්ෂණය, පාරිසරික කටයුතු ඉහළ නැංවීම හා අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහාද ප්‍රතිපත්තිමය තීරණ ගැනීම හා ක්‍රියාත්මක කරවීම. "

## ප්‍රධාන කාර්යයන්

- ගොවිජන සේවා විෂයය සම්බන්ධව සහ වනජීවී සම්පත් සංරක්ෂණයට අදාළව ප්‍රතිපත්ති සැකසීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මහින්ද චින්තන ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික වැඩසටහනට සමගාමීව සංවර්ධන වැඩසටහන් අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු හා ආයතන ඔස්සේ ක්‍රියාත්මක කරවීම.
- සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ හා නඩත්තු කටයුතු ක්‍රියාත්මක කරවීම සම්බන්ධ අධීක්ෂණ කටයුතු.
- 1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අධීක්ෂණ කටයුතු.
- පොහොර සහනාධාරය ක්‍රියාත්මක කරවීම.
- අන්තර් ජාතික වනජීවී සම්මුතීන් ක්‍රියාත්මක කරවීම.
- අදාළ දෙපාර්තමේන්තු හා ආයතනවල ක්‍රියාත්මක සැලැස්මෙහි අඩංගු කාර්යයන් මාසිකව, කාර්තුමය හා වාර්ෂිකව ඇගයීම, මෙහෙයවීම හා අධීක්ෂණය.

# අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු හා ආයතන



# සංවර්ධන අංශය

## දිවි නැගුම වැඩසටහන ප්‍රගතිය

| ව්‍යාපෘතිය | දිස්ත්‍රික්ක 25 ට ලබා දුන් ඉලක්කය | 2012.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ආරක්ෂිත ගෘහ තුළ වාණිජ වගාවන් | 100 | 62 |
| මල් වගා ව්‍යාපෘති | 200 | 148 |
| මී මැසි පාලනය | 5000 | 2413 |
| ගවගාල් ඉදිකිරීම | 1000 | 586 |
| භෝග වර්ග 5 කින් ස්වයංපෝෂිතවීම | 10000 (අක්කර) | 3547 |

## 2012.12.31 දිනට දිස්ත්‍රික්ක වෙත බීජ බෙදා හැරීමේ ප්‍රගතිය

| දිවි නැගුම III අදියර යටතේ බෙදා හරින ලද බීජ පැකට් ප්‍රමාණය | දිවි නැගුම IV අදියර යටතේ බෙදා හරින ලද බීජ පැකට් ප්‍රමාණය |
|---|---|
| 2076983 | 5004691 |

## කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන් සඳහා යෙදවීම/ කුඹුරු ඉඩමක් නොවන බවට සහතිකයක් ලබා දීම (2012.12.31 දිනට ප්‍රගතිය)

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2012.12.31 දිනට ලබා දී ඇති බල පත්‍ර සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | කුඹුරු ඉඩමක් වෙනත් කාර්යයක් සඳහා යෙදවීම | කුඹුරු ඉඩමක් නොවන බවට සහතිකයක් ලබාදීම |
| 1 | කොළඹ | 08 | 15 |
| 2 | ගම්පහ | 09 | 04 |
| 3 | කළුතර | 07 | 03 |
| 4 | මහනුවර | 77 | 21 |
| 5 | මාතලේ | 04 | 03 |
| 6 | නුවරඑළිය | 03 | 01 |
| 7 | ගාල්ල | 01 | - |
| 8 | මාතර | 03 | - |
| 9 | හම්බන්තොට | - | 01 |
| 10 | කුරුණෑගල | 07 | - |
| 11 | පුත්තලම | 01 | 01 |
| 12 | අනුරාධපුර | 01 | - |
| 13 | පොළොන්නරුව | 01 | - |
| 14 | බදුල්ල | 12 | 07 |
| 15 | මොණරාගල | - | - |
| 16 | රත්නපුරය | 09 | - |
| 17 | කෑගල්ල | 07 | 02 |
| 18 | මඩකලපුව | - | - |
| 19 | අම්පාර | - | - |
| 20 | ත්‍රිකුණාමලය | 01 | - |
| 21 | යාපනය | - | - |
| 22 | වව්නියාව | - | - |
| 23 | මුලතිව් | - | - |
| 24 | මන්නාරම | - | - |
| 25 | කිලිනොච්චි | - | - |

ගොවි භාරකාර අරමුදල - **2012.12.31** දිනට ප්‍රගතිය

| අනු අංකය | විස්තරය | මුදල (රු.) | වියදම (රු.) | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | පොහොර ගබඩා ඉදිකිරීම | | | |
| | • හම්බන්තොට - උඩයාල | 312,500.00 | 312,500.00 | 100 |
| | • පොළොන්නරුව - නව නගරය | 1,250,000.00 | 1,250,000.00 | 100 |
| | - මනම්පිටිය | 1,250,000.00 | 1,250,000.00 | 100 |
| | - බකමූණ | 1,250,000.00 | 1,250,000.00 | 100 |
| 2 | කෘෂිකාර්මික සංවර්ධනය කිරීමේ වැඩසටහන - උතුරු පළාත | | | |
| | • ගොවි සංවිධාන වලට කටුකම්බි බෙදා දීම සඳහා ගො. සේ. ම. වලට මූල්‍යාධාර ලබා දීම | 4,000,000.00 | 4,000,000.00 | 100 |
| | • නැවත පදිංචි කරන ලද ගොවීන් 5000කට උදළු තල බෙදා දීමට ගො. සේ. ම. 15කට මූල්‍යාධාර ලබා දීම | 4,000,000.00 | 4,000,000.00 | 100 |
| | • නැවත පදිංචි කරන ලද ගොවීන් 275 කට ඇළ මාර්ග අළුත් වැඩියාවට ආම්පන්න සඳහා ගො. සේ. ම. ට මූල්‍යාධාර ලබා දීම | 2,750,000.00 | 2,750,000.00 | 100 |
| 3 | අම්පාර දිස්ත්‍රික්කයේ කෘෂි මාර්ග 2 ඉදිකිරීමේ වැඩසටහන | | | |
| | • කයිත්ති අඩි බන්ට් පාර | 1,845,591.20 | 1,360,510.00 | 100 |
| | • වම්මවෝලෙ වට්ටෙයි පාර | 1,991,930.90 | 1,749,390.00 | 100 |
| 4 | ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කෘෂි මාර්ග ඉදිකිරීමේ වැඩසටහන | | | |
| | • කල්ලම්පත්තු කෘෂි පාර | 1,494,425.04 | 1,448,481.60 | 100 |
| | • සුංගන්කුලි කෘෂි පාර | 1,966,009.35 | 1,949,212.09 | 100 |
| 5 | ගොම්බද්දල පන්සල අසල ඇති ආරක්ෂිත පැති බැම්ම හා කෘෂි මාර්ග ඉදිකිරීම | 1,000,000.00 | 1,000,000.00 | 100 |

| අනු අංකය | විස්තරය | මුදල (රු.) | වියදම (රු.) | භෞතික ප්‍රගතිය % |
| --- | --- | --- | --- | --- |
| 6 | ප්ලාස්ටික් කුඩ බෙදාහැරීමේ වැඩසටහන | | | |
| | • බදුල්ල | 1,761,750.00 | 156,900.00 | 100 |
| | • නුවරඑළිය | 2,499,749.89 | වාර්තා වී නැත - | 100 |
| 7 | ගො.සේ.ම. අලුත්වැඩියාව | | | |
| | • මුතූර් - ත්‍රිකුණාමලය | 1,834,581.25 | 941,314.76 | 100 |
| | • කොක්කඩිචෝලෙයි - මඩකලපුව | 1,077,020.32 | 1,077,020.32 | 100 |
| 8 | අනුරාධපුර දිස්ත්‍රික් වගා ළිං ව්‍යාපෘතිය | 20,000,000.00 | 20,000,000.00 | 100 |
| 9 | ග්‍රාමීය සුළු වාරිමාර්ග නගා සිටුවීමේ වැඩසටහන | | | |
| | • මාතර | 3,000,000.00 | 2,133,193.00 | 25 |
| | • මහනුවර | 3,000,000.00 | වාර්තා වී නැත | 25 |
| | • කුරුණෑගල | 4,421,908.00 | 4,418,758.00 | 100 |
| | • මන්නාරම | 262,440.00 | 262,440.00 | 100 |
| | • මුලතිව් | 3,880,284.95 | 3,851,915.37 | 100 |
| | • වව්නියා | 6,368,385.60 | 4,312,378.75 | 100 |
| | • අනුරාධපුර | 6,258,189.33 | 2,342,671.63 | 100 |

## සැලසුම් ඒකකය

- 2011 - 2015 සංයුක්ත සැලැස්ම සකස්කර ඇත.
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනවල කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.
- මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව ගොවිජන සේවා, වනජීවී හා පොහොර අංශයන්ට අදාළ ප්‍රගතිය ලබාගැනීමට අවශ්‍ය කාර්යසාධන දර්ශක පිළියෙල කර ඇත.
- 2013 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.
- 2013 වර්ෂයේ අයවැය සැකසීමට සමගාමීව පැවැත්වූ රැස්වීම් සඳහා සහභාගී වී අවශ්‍ය යෝජනා ලබාදෙන ලදී.
- 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.
- 2012 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව සැකසීම සඳහා ගොවිජන සේවා, වනජීවී හා පොහොර අංශයන්ට අදාළ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබාදෙන ලදී.
- රු.මි. 50ට වැඩි ව්‍යාපෘති වල කාර්තු හතරෙහි ප්‍රගතිය මුදල් අමාත්‍යාංශයට යොමු කොට ඇත.
- අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අවස්ථාවේදී ලබාදෙන 2012 වර්ෂයේ ප්‍රගතිය හා ඉදිරි වර්ෂයේ වැඩසටහන් ඇතුළත් වාර්තාව සකස්කර ඉදිරිපත් කර ඇත.
- 2012 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ කටයුතු සාර්ථකව නිමකරන ලදී.
- 2011 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකසා අවශ්‍ය ආයතන වෙත ලබාදී ඇත.
- 2013 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය සම්බන්ධ මූලික කටයුතු සිදුකර ඇත.

# ඉංජිනේරු ඒකකය

## සුළු වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ කටයුතු

- සුළු වාරිමාර්ග සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි 58ක් විසදීමට අවශ්‍ය උපදෙස් ලබා දෙමින් ආදාළ ආයතන වෙත යොමු කර ඇත.
- නියඟයෙන් හානියට පත් දිස්ත්‍රික්ක වල වැව් සහා වගා ළිං ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 500 පමණ ප්‍රතිපාදන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබා ගැනීමට කටයුතු කර ඇත.
- බහු කාර්යයන් සඳහා යොදා ගත හැකි මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 216 ක මුදලක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබා ගැනීමට කටයුතු කර ඇත.
- සුළු වාරිමාර්ග වල තිරසාර සංවර්ධනයට බාජස් මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 93 ක මුදලක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත.
- පානීය ජල ව්‍යාපෘති හා වගා ළිං ව්‍යාපෘති යෝජනා සඳහා ප්‍රතිපාදන අර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබා ගැනීමට කටයුතු කර ඇත.
- පහත සඳහන් දිස්ත්‍රික්ක වල සුළුමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන අර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබා ගැනීමට කටයුතු කර ඇත.

| දිස්ත්‍රික්කය | සුළු වාරිමාර්ග ප්‍රමාණය |
|---|---|
| මාතර | 23 |
| ගම්පහ | 339 |
| අනුරාධපුරය | 183 |
| කොළඹ | 56 |

- ජල සම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳ අදාළ ආයතන මඟින් පවත්වනු ලබන රැස්වීම් සහ වැඩමුළු වලට සහභාගී වී ඇත.

## ඉංජිනේරු කටයුතු

- රු. 8,24,300.00 මුදලක් වැය කරමින් 2012 වර්ෂයේදී අමාත්‍යාංශයට අදාළ සියලුම නඩත්තු කටයුතු නිසි පරිදි ඉටු කර ඇත.
- අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ විදුලි, ජල සැපයුම් හා සනීපාරක්ෂක කටයුතු නඩත්තුව වෙනුවෙන් 2012 දී රු.61,325ක් වැය කර ඇත.

- මෙම අමාත්‍යාංශයේ කාර්යාල කාමරවල වායුසමීකරණ යන්ත්‍ර 40ක් සවි කර ඇති අතර, ඒවා වසරකට තුන් වාරයක් සේවා කටයුතු සිදු කරනු ලබයි. සේවා ගිවිසුම් ගතවීම සඳහා මෙම වර්ෂය තුළදී රු.117,757.36 ක් වැය කර ඇත.

- Fax යන්ත්‍ර 13ක් සේවා කටයුතු සඳහා 2012 වර්ෂයට රු.25442.20 ක මුදලක් ගෙවා ඇත. වසරකට 4 වතාවක් සේවා කටයුතු ඉටු කර ඇත.

- අමාත්‍යාංශයේ photocopy යන්ත්‍ර 13ක සේවා ගිවිසුම් සඳහා 2012 වර්ෂයේ රු.138430ක මුදලක් ගෙවා ඇත. වසරකට 4 වතාවක් සේවා කටයුතු කර ඇත.

- පරිගණක යන්ත්‍රවල අළුත්වැඩියා කටයුතු අවශ්‍ය අවස්ථා වල සිදු කර ඇත.

- අමාත්‍යාංශයේ පරිගණක යන්ත්‍ර 35ක් සම්බන්ධ කරමින් Local Area Net work පද්ධතියක් ස්ථාපිත කරන ලදී. එමගින් අන්තර්ජාල සම්බන්ධතාද ලබාදී ඇති අතර, ඒ සඳහා රු. 395,016.79 ක් වැය කර ඇත.

- ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය සඳහා නිළ වෙබ් අඩවියක් 2012.12.05 දින www.aswlmin.gov.lk යන නමින් එළි දක්වන ලද අතර ඒ සඳහා රු. 190,000 ක මුදලක් වැය කරන ලදී.

- මාසිකව රු.6171.38 ක මුදලක් වැය කරමින් අමාත්‍යාංශ නිලධාරීන් සඳහා විද්‍යුත් ලිපිනයන් 30ක් ලබා දෙන ලදී.

## වනජීවී සංරක්ෂණ කටයුතු

- වනජීවී සම්පත් සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළව ලැබුණු මහජන පැමිණිලි 33 ක් සම්බන්ධව කටයුතු කිරීම අදාළ අංශවෙත යොමු කර ඇත.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව අයත් ඉඩම් සම්බන්ධව පිටස්තර පුද්ගලයන් හා ආයතන අතර පවතින ගැටළු 9ක් නිරාකරණය කිරීමට කටයුතු සලසා ඇත.
- ජාතික උද්‍යාන තුල වැව් ප්‍රතිසංස්කරණය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව වැඩ සටහනක් ක්‍රියාත්මක කරවීම හා එහි ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කර ඇත.

- සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය අවස්ථා වල අමාත්‍යාංශයේ සහය ලබා දී ඇත.
- වන අලින්ගෙන් සිදුවන හානි අවම කිරීම සඳහා වන අලි රැඳවුම් මධ්‍යස්ථාන පිහිටුවීම යටතේ හොරොව්පතාන වන අලි රැඳවුම් මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශය සැකසීම.
- වනජීවී විෂය සම්බන්ධව වෙනත් අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කර තිබූ කැබිනට් පත්‍රිකා සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

- වනඅලි තර්ජනයට ලක් වන ජනතාව උදෙසා සකස් කරනු ලබන රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තුමේන්තුව, අයවැය දෙපාර්තුමේන්තුව, කෘෂි රක්ෂණ මණ්ඩලය සමඟ සාකච්ඡා පවත්වමින් අදාළ කටයුතු සම්බන්ධීකරණය කර ඇත.

## පාලන අංශය

# 2012.12.31 දිනට ප්‍රගතිය

- අමාත්‍යාංශ ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශය වෙතින් වෙන්ව 2010.11.22 දින ආරම්භ කරන ලද අමාත්‍යාංශයෙහි සමස්ත කාර්ය මණ්ඩලය මේ වන විට 220ක් පමණ වේ. එම කාර්ය මණ්ඩලයට අදාළ කටයුතු වන වාර්ෂික වැටුප් වර්ධකයන් ගෙවීම්, සේවය ස්ථිර කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම, විශ්‍රාම වැටුප් සැකසීම ආදී කටයුතු ප්‍රමාදයකින් තොරව ඉටු කිරීමටත් මේ වන විට පෞද්ගලික ලිපි ගොනුවල පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීමත් කර ඇත.

- 2012 වර්ෂය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම උදෙසා අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය පරිගණක පුහුණුවීම්, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පුහුණුවීම් මෙන්ම විෂයානුබද්ධ පුහුණුවීම් සඳහා යොමු කිරීමට කටයුතු කරන ලදී.

- කළමනාකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ පාලන අංශයේ කාර්ය මණ්ඩලයට වඩා පහසුවෙන් හා ප්‍රසන්නව රාජකාරියෙහි නිරත වීමට හැකි පරිදි ප්‍රතිසංස්කරණ කටයුතු කරන ලදී.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් කර ඇති අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් අදියරෙහි ඇත. දෙපාර්තමේන්තු 02ට අදාළ බඳවා ගැනීමේ පටිපාටි 21කින් 04කට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. 07ක් අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II/I ශ්‍රේණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම අනුව එම තනතුරට සුදුසුකම් ලැබූ නිලධාරීන් 05 දෙනෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබාගෙන ඇත.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවුරුදු 20 ට වැඩි කාලයක් පත්වීම් ලිපියක් නොමැතිව සේවය කළ ග්‍රාමීය සමාජ විද්‍යාඥ, පරිසර විද්‍යාඥ, අධ්‍යාපන පුහුණු නිලධාරී තනතුරු 03ට විධිමත් පත්වීම් ලිපි රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ලබාදී ඇත.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වැඩසටහන් සහකාර තනතුරු 34ක්, රියදුරු තනතුරු 12ක්, අභ්‍යන්තර විගණක තනතුරක් හා නීති සහකාර තනතුරක් අනුමත කරවාගෙන ඇත.

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන ක්ෂේත්‍ර රාජකාරිවල නියැලෙන නිලධාරීන් සඳහා දුෂ්කර හා අවදානම් දීමනාව රු. 500සිට රු. 2500දක්වා වැඩි කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2002 වර්ෂයේ සිට සිදුකර නොමැති තාක්ෂණ සේවයේ I පන්තියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇත.
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස් තනතුරු 21ක් සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇත.
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැනට අනුමත ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II වන ශ්‍රේණියේ (අභ්‍යන්තර විගණක) තනතුර යටපත් කර ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන ශ්‍රේණියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කරවා ගෙන ඇත.
- රාජ්‍ය පරිපාලන ලේකම්/ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර අනුමැතිය ලබාගත යුතු කාර්යයන් සතියක් තුළදී අධ්‍යයනය කර අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කර ඇත.
- ප්‍රමාදවී පවත්නා විනය පරීක්ෂණ කඩිනමින් නිම කිරීමට දින, කාලවකවානු ලබාදී කඩිනමින් නිම කිරීමට කටයුතු කිරීම.
- ගොවිජන සේවා හා වනජීවී අංශයට ලැබෙන සියලුම ලිපි සම්බන්ධයෙන් දින 07 ක් ඇතුළත ක්‍රියාමාර්ග ගෙන ඊට අදාළව ක්‍රියා කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරුවල වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් අනුමත කරවා ගැනීමට ක්‍රියා කර ඇත.

## මානව සම්පත් සංවර්ධනය උදෙසා ලබා දුන් පුහුණුවීම්

පුහුණු කිරීම හා හැකියා වර්ධනය සඳහා 2012 වර්ෂයට අනුමත වූ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් දෙලක්ෂ හැත්ත තුන්දහසක් (රු.273,000.00) වූ අතර එම සීමිත ප්‍රතිපාදන යටතේ 2012 වර්ෂය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම උදෙසා නිලධාරීන් විවිධ පුහුණු පාඨමාලා සඳහා යොමු කරන ලදී. මෙහිදී නිලධාරීන්ගේ කාර්ය සාධනය හා ඵලදායීතාව ඉහල නැංවීම සඳහා අවශ්‍ය වන පුහුණු අවශ්‍යතාවයන් හඳුනා ගෙන ඒ අනුව අවශ්‍ය වන්නා වූ පුහුණුවීම් ලබා දීමට කටයුතු කරන ලදී.

| පුහුණුවේ නම | පුහුණුව ලැබූ ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. ඉංග්‍රීසි සහතිකපත් පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 05 |
| 2. ICDL පරිගණක පාඨමාලාව | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 20 |
| 3. ආයතනික සංවර්ධනය සඳහා කාර්යය මණ්ඩල දායකත්වය ප්‍රවර්ධනය කිරීම | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 01 |
| 4. Government Payroll Management | මිලෝදා ආයතනය | 01 |
| 5. Fixed Assets Management | මිලෝදා ආයතනය | 01 |
| 6. රාජ්‍ය ආයතන වල විගණන ප්‍රශ්න අවම කරගන්නේ කෙසේද | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 03 |
| 7. Leadership and Team Building | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 03 |
| 8. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ වැදගත්කම | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 02 |
| 9. දෙමළ භාෂා හැකියාව වර්ධනය කිරීමේ පාඨමාලාව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 45 |

**ගිණුම් අංශය**

# 2012.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

## වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන
## අමාත්‍ය කාර්යාලය

| විස්තරය | 2012 ඇස්තමේන්තුව (රු.මි.) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි.) | 2012.12.31 ට මුළු වියදම (රු.මි.) | % |
|---|---|---|---|---|
| | | | | |
| **පුනරාවර්තන වියදම්** | **20.11** | **20.83** | **20.63** | **99%** |
| පුද්ගල පඩි නඩි | 8.25 | 7.75 | 7.65 | 99% |
| ගමන් වියදම් | 1.20 | 0.68 | 0.65 | 96% |
| සැපයීම් | 5.21 | 5.78 | 5.77 | 100% |
| නඩත්තු වියදම් | 2.15 | 4.93 | 4.91 | 100% |
| සේවා | 3.30 | 1.69 | 1.65 | 98% |
| **මූලධන වියදම්** | **4.40** | **4.48** | **3.94** | **88%** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 1.40 | 1.27 | 0.89 | 70% |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 3.00 | 3.21 | 3.05 | 95% |
| **මුළු වියදම** | **24.51** | **25.31** | **24.57** | **97%** |

## වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන
## ව්‍යාපෘතිය 02 ආයතනික පරිපාලන සේවා

| විස්තරය | 2012 ඇස්තමේන්තුව (රු.මි.) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි.) | 2012.12.31 ට මුළු වියදම (රු.මි.) | % |
|---|---|---|---|---|
| | | | | |
| **පුනරාවර්තන වියදම්** | **43.79** | **41.25** | **41.20** | **100%** |
| පුද්ගල පඩි නඩි | 25.30 | 26.16 | 26.15 | 100% |
| ගමන් වියදම් | 1.25 | 0.72 | 0.70 | 97% |
| සැපයීම් | 6.81 | 6.22 | 6.20 | 100% |
| නඩත්තු වියදම් | 4.45 | 3.76 | 3.76 | 100% |
| සේවා | 5.48 | 3.73 | 3.73 | 100% |
| රාජ්‍ය ණය පොලී | 0.50 | 0.66 | 0.66 | 100% |
| **මූලධන වියදම්** | **8.40** | **7.64** | **6.57** | **86%** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 1.90 | 1.70 | 0.65 | 38% |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 6.20 | 5.64 | 5.63 | 100% |
| හැකියා වර්ධනය | 0.30 | 0.30 | 0.29 | 97% |
| **මුළු වියදම** | **52.19** | **48.89** | **47.77** | **98%** |

**වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන**
**ව්‍යාපෘති 03 - ගොවිජන සේවා**

| විස්තරය | 2012 ඇස්තමේන්තුව (රු.මි.) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි.) | 2012.12.31 ට මුළු වියදම (රු.මි.) | % |
|---|---|---|---|---|
| | | | | |
| **පුනරාවර්තන වියදම්** | **28.05** | **31.42** | **31.40** | **100%** |
| පුද්ගල පඩි නඩි | 25.30 | 28.29 | 28.29 | 100% |
| ගමන් වියදම් | 0.45 | 0.93 | 0.92 | 99% |
| සැපයීම් | 0.90 | 1.49 | 1.49 | 100% |
| නඩත්තු වියදම් | 0.30 | 0.30 | 0.29 | 97% |
| සේවා | 1.10 | 0.41 | 0.41 | 100% |
| **මූලධන වියදම්** | **2.63** | **2.39** | **2.10** | **88%** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 0.18 | 0.18 | 0.01 | 1% |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 0.45 | 0.39 | 0.37 | 95% |
| ආයෝජන - දැයට කිරුළ | 2.00 | 1.82 | 1.73 | 95% |
| **මුළු වියදම** | **30.68** | **33.81** | **33.50** | **99%** |

**වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන**
**ව්‍යාපෘති 04 - පොහොර පනත ක්‍රියාත්මක කිරීම**

| විස්තරය | 2012 ඇස්තමේන්තුව (රු.මි.) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි.) | 2012.12.31 ට මුළු වියදම (රු.මි.) | % |
|---|---|---|---|---|
| | | | | |
| **පුනරාවර්තන වියදම්** | **33826.41** | **36482.57** | **36482.34** | **100%** |
| පුද්ගල පඩි නඩි | 20.00 | 20.00 | 19.99 | 100% |
| ගමන් වියදම් | 0.30 | 0.68 | 0.68 | 100% |
| සැපයීම් | 0.61 | 0.66 | 0.65 | 99% |
| නඩත්තු වියදම් | 0.20 | 0.61 | 0.60 | 98% |
| සේවා | 5.30 | 4.18 | 3.98 | 95% |
| මාරු කිරීම් (පොහොර සහනාධාරය) | 33800.00 | 36456.44 | 36456.44 | 100% |
| **මූලධන වියදම්** | **130.12** | **118.41** | **74.69** | **63%** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 0.17 | 0.17 | 0.08 | 47% |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 4.95 | 0.45 | 0.44 | 98% |
| කාබනික පොහොර | 125.00 | 117.79 | 74.17 | 63% |
| **මුළු වියදම** | **33956.53** | **36600.98** | **36557.03** | **100%** |

# අභ්‍යන්තර විගණන අංශය

## 2012.12.31 දිනට ප්‍රගතිය

- මාලඹේ, වීරවිල, ගලහිටියාව, නාගොඩ හා මිහින්තලේ ගොවිජන සේවා මධ්‍යස්ථානවල සහ කළුතර ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලයේ අභ්‍යන්තර විගණන පරීක්ෂාව සිදු කර ඇත.
- ඇඹිලිපිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පොහොර තොග පරීක්ෂාව.
  (විශේෂ විගණන විමර්ශනය)
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ලුණුගම්වෙහෙර, නැගෙනහිර හා අනුරාධපුර සහකාර අධ්‍යක්ෂ කාර්යාල විගණන සිදු කර ඇත.
- උඩවලව ජාතික උද්‍යානය හා බිට්ටු කාර්යාල, විල්පත්තු හා ලාහුගල ජාතික උද්‍යාන හා ඊට අයත් අඩවි කාර්යාල හා බිට්ටු කාර්යාල අභ්‍යන්තර විගණන පරීක්ෂාව
- සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ සේවක පිරිසක් ඉදිරිපත් කරන ලද පෙත්සමක් සම්බන්ධ විශේෂ විගණන පරීක්ෂණය.
- තුම්මුල්ල සංචාරක බංගලාව ඉදිකිරීම් සම්බන්ධ විගණන පරීක්ෂාව.
- සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විගණන පරීක්ෂණ වාර්තාව පොහොර ගබඩාකරණය සහ සීප්පුකුලම පොහොර ගබඩාව ඉදිකිරීම පිළිබඳ විගණන පරීක්ෂණය.
- විශේෂ පරීක්ෂණය සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.
- ගොවිජන හා වනජීවී අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරුන් ලෙස පත්වීම් ලද නිලධාරීන්ගේ වැටුප් පරිමාණයන් ගණනය කිරීම පරීක්ෂා කිරීම.
- අමාත්‍යාංශ 2012 - ජනවාරි සිට දෙසැම්බර් දක්වා සංචිත වාහනවල දෛනික ධාවන සටහන් පිරිවැය පරීක්ෂාව
- 2012 වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 4 ක් පැවැත්වීම මගින් අමාත්‍යාංශයට හා එයට අයත් ආයතනයන්හි මනා මූල්‍ය පාලනයක් ඇතිකර ගැනීමට ඉහළ කළමනාකාරිත්වයට සහාය වීම.

## විමර්ශන අංශය

# 2012 .12.31 දිනට ප්‍රගතිය

| පළාත | දිස්ත්‍රික්කය | විවෘත කර ඇති ගොනු ගණන | විමර්ශන අවසන් කර ඇති ගොනු ගණන | ප්‍රගතිය |
|---|---|---|---|---|
| බස්නාහිර පළාත | කොළඹ<br>ගම්පහ<br>කළුතර | 19<br>4<br>10 | 8<br>3<br>8 | 42%<br>75%<br>80% |
| මධ්‍යම පළාත | මහනුවර<br>නුවර එළිය<br>මාතලේ | 7<br>1<br>1 | 5<br>1<br>1 | 71%<br>100%<br>100% |
| දකුණු පළාත | ගාල්ල<br>මාතර<br>හම්බන්තොට | 2<br>6<br>11 | 2<br>3<br>5 | 100%<br>50%<br>45% |
| නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය<br>අම්පාර<br>මඩකලපුව | 3<br>4<br>3 | 0<br>1<br>0 | 0%<br>25%<br>0% |
| වයඹ පළාත | කුරුණෑගල<br>පුත්තලම | 6<br>2 | 6<br>0 | 100%<br>0% |
| උතුරුමැද පළාත | අනුරාධපුර<br>පොලොන්නරුව | 9<br>5 | 1<br>3 | 11%<br>60% |
| ඌව පළාත | බදුල්ල<br>මොණරාගල | 4<br>5 | 3<br>2 | 75%<br>40% |
| සබරගමුව පළාත | රත්නපුරය<br>කෑගල්ල | 3<br>4 | 0<br>4 | 0%<br>100% |
| එකතුව | | **109** | **56** | **51%** |

## ආයතනිකව සිදු කරන ලද විමර්ශන පිළිබඳ තොරතුරු

| ආයතනය | විවෘත කර ඇති ගොනු ගණන | විමර්ශන අවසන් කර ඇති ගොනු ගණන | ප්‍රගතිය |
|---|---|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 84 | 38 | 45% |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 22 | 17 | 77% |
| සී/ස. ලංකා පොහොර සමාගම | 01 | 0 | 0% |
| සී/ස. කොමර්ෂල් පොහොර සමාගම | 02 | 01 | 50% |
| එකතුව | **109** | **56** | **51%** |

අවසන් කොට ඇති මූලික විමර්ශන 56 සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා වූ අදාළ නිර්දේශයන් ආයතන ප්‍රධානීන් වෙත යොමු කොට ඇත.

# නීති අංශය

## කාර්යභාරය

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, සී/ස පොහොර සමාගම, සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සහ ජාතික පොහොර ලේකම් කාර්යාලය යන ආයතන සම්බන්ධව අමාත්‍යාංශය විසින් ඉටුකළ යුතු නීති කටයුතු අධීක්ෂණය කිරීම නීති අංශය විසින් සිදු කරනු ලබයි.

මෙම කාර්යයන්

- 1937 අංක 07 දරණ වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත ක්‍රියාත්මක කිරීම.
- 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීම.
- 1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනත ක්‍රියාත්මක කිරීම.

මෙම පනත් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා එම පනත් සඳහා අවශ්‍ය වන්නා වූ රෙගුලාසි, නියෝග හා සංශෝධන සකස් කිරීම සඳහා උපදේශාත්මක සේවාවන් ඉටු කිරීමත්, එම සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීමත් සිදුකරනු ලබයි.

අඳ ගොවි ගැටළු හා ඒ සම්බන්ධ වෙනත් කරුණු සම්බන්ධයෙන් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම සිදු කරන ලදී. එම නව ගොවිජන සංවර්ධන පනත් කෙටුම්පත 2011 ඔක්තෝබර් 20 වන දින පාර්ලිමේන්තුවේදී සම්මත කරගනු ලැබුණි. එය 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධිත) පනත ලෙස ප්‍රකාශයට පත් කෙරුණි. ඒ අනුව දැනට සිටින අඳ ගොවියන්ගේ උරුමකරුවන් වෙත අඳ ගොවි අනුප්‍රාප්තිය උරුම වීමට අදාළ විධිවිධාන ඒක පුද්ගල විනිශ්චය සභාවක් පත්කිරීමේ විධිවිධාන සහ සමාලෝචන මණ්ඩල පිහිටුවා ඇත.

තත්කාලයේ බල පවත්නා ජාතික වනජීවී ප්‍රතිපත්තිය හා නීතිය ඵලදායීව ක්‍රියාත්මක කිරීම වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ කාර්යයයන් වන අතර ඒ සඳහා පනතේ විධිවිධාන යටතේ අත්‍යාවශ්‍ය නියෝග සම්පාදනය කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව සිදු කරනු ලබයි.

එමෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නීතිමය කටයුතු සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග විධිමත්ව සිදුනොවන අවස්ථා පිළිබඳව , අමාත්‍යාංශය වෙත ලැබෙන ලිපි හා පැමිණිලි සම්බන්ධව අවශ්‍ය උපදෙස් ලබාදීම සිදු කරනු ලබයි

2012.10.30 වන දින අමාත්‍ය මණ්ඩල තීරණ යටතේ සී/ස. ජනතා පොහොාර ව්‍යවසාය ස්වෙච්ඡාවෙන් ඈවර කිරීමට තීරණය කර ඇති බැවින්, එම තීරණය ක්‍රියාත්මක කිරීමට අදාළ කාර්යය සම්පාදනය නීති අංශය විසින් ඉටු කරනු ලබයි.

අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමග පවත්වනු ලබන උපදේශාත්මක සාකච්ඡා සඳහා සහභාගී වීම සහ අවශ්‍ය නිරීක්ෂණ සකස් කර ඉදිරිපත් කිරීම.

එමෙන්ම අමාත්‍යාංශයට එරෙහිව හා අමාත්‍යාංශය වෙනුවෙන්ද යටතේ ගැනෙන දෙපාර්තමේන්තු සහ සමාගම්වල නඩු, ගිවිසුම්, නීති උපදෙස් හා අධිකරණ කටයුතු වලට අදාළ අනෙකුත් සියලුම නඩු කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණ කටයුතු නීති අංශය විසින් ඉටු කරනු ලබයි.

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

## දැක්ම

" ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ හා සියළු කෘෂිකාර්මික ඉඩම් වල තිරසාර සංවර්ධනය."

## මෙහෙවර

''ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර සංවර්ධනය හා සියළුම කෘෂිකාර්මික ඉඩම් වලින් ප්‍රශස්ත ඵලදායීතාවක් ලබා ගත හැකි වන පරිදි ආයතන, සහායක, නෛතික හා කළමනාකරණ සේවාවන් සැකසීම හා කාලානුරූපව පවත්වාගෙන යාම."

# සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය - 2012

## 1. පුරන්කුඹුරු අස්වැද්දීම යටතේ සුළු වාරිමාර්ග අළුත්වැඩියාව

| | |
|---|---|
| **2012 වෙන්කළ ප්‍රතිපාදන** | රු.මි.196.5 |
| **මූල්‍ය ප්‍රගතිය** | 67% |
| **ප්‍රතිලාභී ගොවි පවුල් සංඛ්‍යාව** | 8428 |
| **අලුතින් වගා කිරීමට ඇති කුඹුරු අක්කර ප්‍රමාණය** | 4271 |
| **ඉලක්කගත සුළු වාරිමාර්ග සංඛ්‍යාව** | 218 |
| **භෞතික ප්‍රගතිය** | |
| 75% වැඩි වාරි කර්මාන්ත | 99 |
| 74% - 50% වාරි කර්මාන්ත | 92 |
| 49% - 25% වාරි කර්මාන්ත | 13 |
| 25% ට අඩු වාරි කර්මාන්ත | 14 |

## 2. ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියාව



2012 වසරේ රු.මි. 100ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කර ඇති අතර එයින් රු.මි.50ක් දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියාව සඳහා වෙන් කර ඇති අතර ඉතිරි රු.මි.50 දිවයිනේ අනෙකුත් දිස්ත්‍රික්ක වල ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියාව සඳහා වෙන් කර ඇත.

| විස්තරය | වෙන්කළ ප්‍රතිපාදන (රු.මි.) | ඉලක්කය (ගො. සේ.ම.) | ප්‍රගතිය (2012.12.31) | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| අවිච්ඡේද කර්මාන්ත | 3.8 | 7 | 3.05 | 2011 වර්ෂයේ අවිච්ඡේද කර්මාන්ත 9ක වැඩ අවසන් කර ඇත. |
| නව කර්මාන්ත | 46.2 | 59 | 32.7 | 100% - 55<br>25% - 50% - 03<br>25% අඩු - 01 |

## 3. දිස්ත්‍රික් කාර්යාල අලුත්වැඩියාව

| විස්තරය | වෙන්කළ ප්‍රතිපාදන (රු.මි.) | ඉලක්කය | ප්‍රගතිය (2012.12.31) | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| අඛණ්ඩ කර්මාන්ත | 5.03 | 9 | 4.9 | ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාල 9ක ප්‍රතිසංස්කරණ අවසන් කර ඇත. |
| නව කර්මාන්ත | 15.0 | 39 (ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල 5) | 14.17 | 100% - 37<br>95% - 01<br>50% - 01 |

වැය ශීර්ෂය යටතේ වෙන් වූ මුළු ප්‍රතිපාදනය රු.මි. 22.0කි. එයින් රු.මි. 1.915 ක ඇස්තමේන්තු කපා හැරීමක් සිදුකර ඇති අතර ඉතිරි රු.මි. 20.085 ඉහත පරිදි බෙදා වෙන් කර ඇත.

## නව ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම

උතුරු නැගෙනහිර ඇතුළුව අනෙකුත් ප්‍රදේශ ආවරණය වන පරිදි ගොවිජනතාව සඳහා කාර්යක්ෂම

| විස්තරය | වෙන්කළ ප්‍රතිපාදන (රු.මි.) | ඉලක්කය | ප්‍රගතිය (2012.12.31) | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| අඛණ්ඩ කර්මාන්ත | 40.0 | 5 | 21.06 | 100% - 03<br>50% - 75% - 02 |
| නව කර්මාන්ත | | 3 | - | 100% - 02 |
| දැයට කිරුළ | | 11 | - | |

සේවාවක් සැපයීමට ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම අත්‍යාවශ්‍ය කරුණක් වේ.

## 4. පොහොර ගබඩා ඉදිකිරීම



| වෙන්කල ප්‍රතිපාදනය (රු.මි. ) | ඉලක්කය | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| **2.6** | **3** | **2.4** | 100% |

### දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය

2012 වර්ෂයේ දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව විවිධ සංවර්ධන ක්‍රියාකාරකම් අප දෙපාර්තමේන්තුව තුළින් සිදු කෙරිණි. මෙහිදී ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියාව ප්‍රධාන වශයෙන් අප දෙපාර්තමේන්තුවෙන් සිදු විය.

| ව්‍යාපෘතිය | වෙන්කල ප්‍රතිපාදනය (රු.මි.) | ඉලක්කය | වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියාව | 50.0 | 35 | 36.9 | 96%ක් ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇත. |

## 5. 2KR ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය වැඩිකිරීමෙහිලා වූ ජපන් ආධාර වැඩසටහන යටතේ, දැනට වසර 20කට අධික කාලයක පමණ සිට කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත රෝද 04 ට්‍රැක්ටර්, රෝද 02 ට්‍රැක්ටර්, වතුර පොම්ප ආදී කෘෂි යන්ත්‍රෝපකරණ ලැබෙන අතර ඒවා ක්‍රියාකාරී ගොවි සංවිධාන සාමාජිකයන් වෙත බෙදා හැරේ.

## 2012.12.31 දිනට ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | රෝද 2 අත් ට්‍රැක්ටර් | රෝද 4 අත් ට්‍රැක්ටර් |
|---|---|---|
| කොළඹ | - | - |
| ගම්පහ | - | - |
| කළුතර | - | - |
| මහනුවර | 5 | - |
| මාතලේ | 6 | - |
| නුවරඑළිය | 6 | - |
| ගාල්ල | 5 | - |
| මාතර | 18 | 1 |
| හම්බන්තොට | 40 | 2 |
| යාපනය | 80 | - |
| වව්නියා | 75 | - |
| මුලතිව් | 75 | 2 |
| මන්නාරම | 55 | 2 |
| කිලිනොච්චි | 65 | - |
| මඩකලපුව | 55 | 2 |
| අම්පාර | 50 | 3 |
| ත්‍රිකුණාමලය | 50 | 3 |
| කුරුණෑගල | 30 | 3 |
| පුත්තලම | 25 | 2 |
| අනුරාධපුර | 56 | 4 |
| පොළොන්නරුව | 24 | 2 |
| බදුල්ල | 40 | 2 |
| මොණරාගල | 40 | 2 |
| රත්නපුර | 10 | 1 |
| කෑගල්ල | 10 | 1 |
| **එකතුව** | **820** | **32** |

## 6. සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය





මෙම දෙපාර්තමේන්තුව ආරම්භයේ සිටම සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය ප්‍රධාන කාර්යයක් ලෙස ක්‍රියාවට නංවා ඇත. 2000 ග්‍රාමීය වාරිමාර්ග සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාව පුරා වැව් 11,257ක් සහ අමුණු 12,942ක් ඇත. මෙයට සම්බන්ධ වාරිමාර්ග ප්‍රමාණය අතිවිශාලය. වී ගොවිතැනේ යෙදෙන ගොවීන් වෙනුවෙන් මේවා නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පසුගිය වර්ෂ 50ක කාලය තුළ ඉටු කරන ලදී.

## 2012.12.31 දිනට ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | වෙන්කල ප්‍රතිපාදන (රු.මි.) | යෝජිත සුළු වාරිමාර්ග සංඛ්‍යාව | 2012.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| අනුරාධපුරය | 200.00 | 119 | 131.36 | සුළු වාරිමාර්ග<br>99 - 100%<br>11 - 75% -100%<br>9 - 50% - 75% |
| කුරුණෑගල | 21.6 | 38 | 17.09 | සුළු වාරිමාර්ග<br>35 - 100%<br>1 - 80%<br>2 - 25% - 50% |

## 7. ගොවි බැංකු

කෘෂිකර්මාන්තය සිය ප්‍රධාන ජීවිකාව කරගත්, මෙරට ග්‍රාමීය දිළිඳු ගොවින්ගේ ණය අවශ්‍යතා සපුරාලීම හා ඔවුන්ගේ ඉතිරි කිරීම් ඉහළ නැංවීම මගින් ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ තලයකට ගෙන ඒම පෙරදැරි කරගනිමින්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 1998 වර්ෂයේදී ගොවිජන සංවර්ධන බැංකු ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් වශයෙන් ආරම්භ කරන ලදී.

2010 වර්ෂය වන විට දිවයිනේ ස්ථාපිතවූ ගොවිජන බැංකු 472 ක ප්‍රමාණය, උතුරට හා නැගෙනහිරටද ගොවිජන බැංකු 43 ක් ආරම්භ කරමින් මේ වන විට දිවයිනේ සියළුම දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වන ගොවිජන බැංකු ගණන 529ක් දක්වා වර්ධනය කර ඇත.

ගොවි බැංකු (නියමු) ව්‍යාපෘතිය යටතේ රු. 25,000.00ක උපරිමයක තිබූ ව්‍යාපෘති ණය සීමාව රු. 100,000.00ක් දක්වා වර්ධනය කරමින් 2012 වර්ෂය තුළදී මෙම වැඩසටහන යටතේ ගොවීන් 571 දෙනෙකුට පමණ ණය ලබා දී ඇත.

### 2012.12.31 දිනට ප්‍රගතිය

| | | |
|---|---|---|
| සාමාජිකත්වය ලැබූ නව කොටස්කරුවන් | - | 49051 |
| ඉතුරුම් ගිණුම් ආරම්භ කල නව තැන්පත් කරුවන් | - | 45286 |
| නව ඉතුරුම් ගිණුම් | - | 7386 |

ගොවිජනබැංකු 150ක් සඳහා සේප්පු ලබා දී ඇත.
ගොවිජන බැංකු 100ක් සඳහා ත්‍රෛභාෂික නාම පුවරු ලබාදී ඇත.

ණය නිකුත් කිරීම (2012.12.31 දිනට)

| | | |
|---|---|---|
| කෘෂි ණය | - රු.මි. | 479 |
| ව්‍යාපෘති ණය | - රු.මි. | 255 |
| 100, 000 ණය | - රු.මි. | 32.5 |

## 8. ගොවිජන සංවර්ධන අරමුදල

2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 97 වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන අරමුදල පිහිටුවා ඇත.

මෙම අරමුදල යටතට ගැනෙන ආදායම් ශීර්ෂ පහතින් දැක්වේ.

- මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් පනවන ලබන සියළු දඩ
- මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ඒ අරමුදලට ගෙවිය යුතු සියළු මුදල් සහ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළු මුදල්
- පාර්ලිමේන්තුව විසින් කලින් කල අරමුදල සඳහා වෙන් කර දෙනු ලබන සියළු මුදල්
- ඒ අරමුදලට ගෙවිය යුතු යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කල නියම කරනු ලබන සියළු මුදල්
- මේ පනත යටතේ අක්කර බද්ද වශයෙන් එකතු කර ගනු ලබන සියළු මුදල්වලින් නියමිත ප්‍රතිශතය

ඒ අනුව 2012 වර්ෂය තුළ පහත කාර්යයන් සඳහා ගොවිජන සංවර්ධන අරමුදල භාවිතයට ගෙන ඇත.

## 2012.12.31 දිනට ප්‍රගතිය

| අනු අංකය | විස්තරය | ප්‍රතිපාදන (රු.) | 2012.12.31ට වියදම | ප්‍රතිශතය (%) | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 1 | නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති බලාත්මක කිරීම | 1,600,000.00 | 45,900.00 | 2.87 | |
| 2 | සැපයුම් වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය | 9,200,000.00 | 5,163,785.33 | 56.13 | |
| 3 | ගොවිජන කේන්ද්‍රය පරිපාලනය කිරීම හා සංවර්ධනය කිරීම | 100,000.00 | 394,635.63 | 100 | වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් ප්‍රතිපාදන මාරු කිරීමක් සිදු කර ඇත. |
| 4 | මධ්‍යස්ථානවල ගොඩනැගිලි, වාහන සහ උපකරණ නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම | 3,000,000.00 | 101,345.16 | 3.38 | |
| 5 | ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි භෞතික සම්පත් වර්ධනය කිරීම | 2,000,000.00 | 1,018,497.60 | 50.92 | |
| 6 | නිලධාරීන් පුහුණු කිරීම | 300,000.00 | - | | |
| 7 | පරීක්ෂණ කටයුතු | 1,000,000.00 | 76,673.00 | 7.67 | |
| 8 | ප්‍රවාහන පහසුකම් | 50,000.00 | - | | |
| 9 | මූල්‍යාධාර සැපයීම | 1,200,000.00 | 543,000.00 | 45.25 | |
| 10 | වෙනත් පුනරාවර්තන වැය | 1,000,000.00 | 16,395.00 | 1.64 | |
| 11 | රෝද 2 හා 4 ට්‍රැක්ටර් වාරික ආපසු යැවීම | 41,000,000.00 | - | | |
| 12 | අත්තිකාරම් | | 767,331.16 | | |
| **එකතුව** | | **60,450,000.00** | **8,127,562.88** | **13.45** | |

### සාකච්ඡා හා සම්මේලන

| වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | සාකච්ඡා ගණන | **2012.12.31** දිනට වියදම (රු.මි) |
|---|---|---|
| 1.2 | 26 | 1.13 |

### පුහුණු හැකියා වර්ධනය

| වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | සාකච්ඡා ගණන | **2012.12.31** දිනට වියදම (රු.මි) |
|---|---|---|
| 2.25 | 35 | 2.36 |

## සමස්ත මූල්‍ය ප්‍රගතිය (2012.12.31 දිනට)

| අයිතමය | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | ප්‍රතිශතය |
|---|---|---|---|
| වර්තන වියදම් | 3260.08 | 3,259.93 | 100% |
| ප්‍රාග්ධන වියදම් | 776.99 | 562.06 | 72.34% |
| **එකතුව** | **4,037.07** | **3,821.99** | **94.67%** |

# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව



.

## දැක්ම

“ වර්තමාන හා ඉදිරි පරම්පරාවන් උදෙසා වනජීවී සම්පත් දිගුකාලීනව සංරක්ෂණය කිරීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැක්ම වෙයි.”

## මෙහෙවර

“ සියල්ලන් හා එක්ව වෘත්තීයමය කළමනාකරණයක් මගින් වනජීවී සම්පත්වල සංරක්ෂණය සහතික කිරීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත මෙහෙවර වන්නේය.”

## සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය - 2012

## 1. ගජමිතුරෝ වැඩසටහන

අලි මිනිස් ගැටුමින් තොර ශ්‍රී ලංකාවක් තේමා කර ගනිමින් ගජමිතුරෝ වැඩසටහන ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය රු.මි. 1250ක මුළු වියදමකින් වසර 4ක කාලයකින් අවසන් කිරීමට අපේක්ෂිතය.

**අරමුණු**

- අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා විදුලි වැට ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය.
- වන අලින්ගෙන් වන හානි සඳහා වන්දි ගෙවීම.
- අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා ක්‍රමෝපායන් සංවර්ධනය සහ හැකියා වර්ධනය.




| | | |
|---|---|---|
| **2012 වෙන්කළ ප්‍රතිපාදන** | **-** | **රු.මි. 200.0** |
| **මූල්‍ය ප්‍රගතිය** | **-** | **රු.මි. 177.6** |

**භෞතික ප්‍රගතිය**

- 2012 වසර තුළ කි.මී. 192 දිග විදුලි වැට ඉදිකර අවසන් කර ඇත.
- කි.මී. 412ක් දිග විදුලි වැටවල් සඳහා භාණ්ඩ මිලදී ගැනීම අවසන් කර ඇත.
- බදුලුවෙල අලි පාලන ඒකකයේ සහ ලුණුගම්වෙහෙර සපත්තු පාලම් ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.
- දැනට ඇති විදුලි වැටවල් නඩත්තු කිරීම සිදුකරමින් පවතී.

## 2. හොරොව්පතාන අලි සංරක්ෂණ උද්‍යානය ඉදිකිරීම

වසර 3ක කාලයකින් අවසන් කිරීමට අපේක්ෂිත ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මි. 504කි.

**අරමුණු**

- අලි - මිනිස් ගැටුම පවතින ප්‍රදේශවල සමාජ - ආර්ථික හානි අවම කිරීම
- වන අලි සංරක්ෂණ උද්‍යාන ආශ්‍රිතව පාරිසරික සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම
- වන අලි සංරක්ෂණ උද්‍යාන අවට ප්‍රදේශයේ ජනතාවට ආදායම් උත්පාදන මාර්ග බිහිකරදීම

**2012 වෙන්කළ ප්‍රතිපාදන - රු.මි. 200.0**

**මූල්‍ය ප්‍රගතිය - රු.මි. 80.4**

**භෞතික ප්‍රගතිය**

- කි.මී. 16ක් දිග විදුලි වැට මාර්ගය එළිපෙහෙළි කර ඇති අතර කි.මී. 02ක් මාර්ගය සකස් කර අවසන් කර ඇත.
- විශේෂයෙන් සැලසුම් කරන ලද විදුලි වැට කොන්ක්‍රීට් කණු 1,800ක් පමණ ඉදිකර අවසන් කර ඇති අතර කණු සිටුවීම ආරම්භ කර ඇත. 2012 දෙසැම්බර් මස අවසාන වනවිට කණු 225ක් සිටුවා අවසන් කර ඇත.
- වැව් 04ක් ඉදි කිරීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර ඇති අතර එහි වැඩ ආරම්භ කර ඇත.
- කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

## 3. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ විල්පත්තු ජාතික උද්‍යානය සංවර්ධනය කිරීම

2012 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව විල්පත්තු ජාතික උද්‍යානයේ පහත සඳහන් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

- ජාතික උද්‍යාන තුළ පාරිසරික සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම
- වනජීවී රක්ෂිත ජාලය තුළ පරිපාලන සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- වනජීවී රක්ෂිත ජාලය පුළුල් කිරීම
- තොරතුරු සන්නිවේදන ජාලය ප්‍රවර්ධනය කිරීම

**2012 වෙන්කළ ප්‍රතිපාදන - රු.මි. 126.0**

**මූල්‍ය ප්‍රගතිය - රු.මි. 67.1**

**භෞතික ප්‍රගතිය**



- 2012 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සාර්ථකව පවත්වා අවසන් කරන ලදී.



- විල්පත්තුව ජාතික උද්‍යානයේ තන්තිරිමලේ සහ මහවිලච්චිය උද්‍යාන ප්‍රවේශයන් 2012 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව විවෘත කරන ලදී.

- කි.මී. 7ක් දිග විදුලි වැට දැයට කිරුළ ප්‍රදර්ශන භූමිය වටා ඉදිකළ අතර කි.මී. 95ක් දිග හුණුවිල-බොගොඩ-මල්වතුඔය දක්වා විදුලි වැට සඳහා භාණ්ඩ මිලදී ගැනීම අවසන් කර ඇති අතර කි.මී. 60ක් දිග එම විදුලි වැට මාර්ගය සුද්ද කර එයින් කි.මි. 39.5ක් දිග විදුලි වැට ඉදිකිරීම අවසන් කර ඇත.
- විල්පත්තුව ජාතික උද්‍යානයේ කි.මී. 100ක් දිග මාර්ග සංවර්ධනය කර ඇත. තන්තිරිමලේ, එළුවන්කුලම, කලාඔය සහ මහවිලච්චිය ප්‍රවේශ කාර්යාලය සහ මොල්ලිකුලම ගොඩනැගිලි ඉදිකිරීම අවසන් කර ඇත.
- විල්පත්තුව ජාතික උද්‍යානයේ වැව් 05ක් ඉදිකර ඇත.

## 4. මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ සිදුකරන වනජීවි සංරක්ෂණ කටයුතු

දැනට වාරිමාර්ග ජල කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන මොරගහකන්ද - කළු ගඟ ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ 2008 වසරේ සිට වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව මඟින් කළු ගඟ ගංභාධාර ප්‍රදේශයේ පහත අරමුණු උදෙසා වනජීවී සංරක්ෂණ කටයුතු ක්‍රියාවට නංවනු ලබයි.

**2012 වෙන්කළ ප්‍රතිපාදන - රු.මි. 50.0**

**මූල්‍ය ප්‍රගතිය - රු.මි. 43.42**

**භෞතික ප්‍රගතිය**

- කවුඩුල්ල ජාතික උද්‍යානයේ රජ්ජම්මාන බීට්ටු කාර්යාල 02ක් ඉදිකිරීම සම්පූර්ණ කරන ලදී.
- කි.මි. 204ක් දිග විදුලි වැටවල් ඉදිකිරීම් සඳහා විදුලිවැට උපකරණ මිලදී ගැනීම සිදුකර ඇති අතර විදුලි වැටවල් සඳහා බල ශක්ති කුටි 04ක් ඉදිකර අවසන් කර ඇත.
- දැන්වීම් පුවරු 54ක් වස්ගමුව සහ කවුඩුල්ල ජාතික උද්‍යාන වල ස්ථාපිත කර ඇත.
- දැන්වීම් පුවරු 54ක් වස්ගමුව සහ කවුඩුල්ල ජාතික උද්‍යාන වල ස්ථාපිත කර ඇත.
- මෝටරෝලා ගුවන් විදුලි උපකරණ 15ක් මිල දී ගැනීම සිදු කර ඇත.
- වස්ගමුව ජාතික උද්‍යානයේ සපත්තු පාලම් 03ක ඉදිකිරීම් අවසන් කර ඇත.
- බංගලා භාරකරුවන් සහ අනෙක් වනජීවී නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා පවත්වන ලදී.
- අන්ගම්මැඩිල්ල සහ මින්නේරිය ජාතික උද්‍යාන වල කඳවුරු බිම් 01ක් සංවර්ධනය කර ඇත.
- හෙක්ටයාර් 150ක තෘණ භූමි නඩත්තුව සම්පූර්ණ කරන ලදී.
- Single Cab 02ක් වනජීවී රක්ෂිත ප්‍රදේශවල සේවයට එක් කරන ලදී.

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය (2012 .12.31 දිනට)**

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1. | **රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපිත කිරීම.**<br><br>හොරොව්පතාන ජාතික උද්‍යානයේ දැන්වීම් පුවරුව<br><br>මුතුරාජවෙල අභයභූමියේ දැන්වීම් පුවරුවක් | **7.5** | **7.44** | • පානම - කුඩිම්බිගල, ගල්ඔය, විල්පත්තු, සෝමාවතිය, මාදුරුඔය ජාතික උද්‍යානය සහ මදුනාගල, වික්ටෝරියා, රන්දෙනිගල, රංටැඹේ අභය භූමිය සහ හග්ගල දැඩි රක්ෂිතයේ මායිම් කණු 1,222ක් ස්ථාපිත කිරීම සිදුකර ඇත.<br>• රක්ෂිත ප්‍රදේශවල නාම පුවරු 77 ක් ස්ථාපිත කර අවසන් කර ඇති අතර නාම පුවරු 12 ක් ප්‍රතිසංස්කරණය සිදු කර ඇත. |
| 2. | **පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය.**<br><br>රිටිගල ඇත් අතුරු සෙවන<br><br>එග්ගල්ඔය වනජීවී සංචාරක බංගලාව | **11.0** | **6.25** | • රිටිගල ඇත් අතුරු සෙවන 2012.03.24 දින විවෘත කරන ලදී.<br>• ස්වේච්ඡා මාර්ගෝපදේශකයින්ගේ හැකියා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් 03ක් පවත්වා ඇත.<br>• යාල ජාතික උද්‍යානයේ රවි සමරසිංහ අනුස්මරණ සංචාරක හා තොරතුරු මධ්‍යස්ථානය 2012.01.08 දින සහ මාදුරුඔය ජාතික උද්‍යානයේ එඬේරඇටමුල්ල වනජීවී සංචාරක බංගලාව 2012.06.01 දින සංචාරකයින් සඳහා විවෘත කරන ලදී.<br>• වනජීවී සංචාරක බංගලා 05ක පහසුකම් වැඩි දියුණු කර ඇත. |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 3. | **ජනවිහිදුම්කරණ වැඩසටහන.**<br><br>ජීව වැටක්<br><br>සවිය කාන්තා වැඩසටහන යටතේ අත්කම් භාණ්ඩ දිරිගැන්වීම | **1.6** | **1.65** | • සමනල අඩවිය තුළ ශ්‍රමදාන වැඩසටහන් 06ක් සහ වනජීවී සංරක්ෂණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 06ක් සහ සවිය කාන්තා වැඩසටහන අවසන් කිරීම.<br>• රක්ෂිත ප්‍රදේශ අවට කි.මී.10ක් දිග ජීව වැටවල් නඩත්තු කර ඇත.<br>• රක්ෂිත ප්‍රදේශ අවට පළතුරු පැල වගා කිරීමේ ව්‍යාපෘති 02 ක් අවසන් කර ඇත.<br>• කුමන ජාතික උද්‍යානයේ කඩොලාන වගා කිරීමේ ව්‍යාපෘති 02ක් අවසන් කර ඇත. |
| 4. | **තර්ජනයට ලක් වු ජීවීන් සංරක්ෂණය.**<br><br> | **3.5** | **2.82** | • කුමන, හික්කඩුව, කලමැටිය සහ බුන්දල ජාතික උද්‍යාන තුළ කැස්බෑ සංරක්ෂණය සඳහා අභිජනන ස්ථාන සංවර්ධනය හා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සිදු කරන ලදී.<br>• උඩවලව ඇත් අතුරු සෙවනින් අලි පැටවුන් 09ක් නිදහස් කරනු ලැබීය.<br>• අතුරුගිරිය ප්‍රදේශයේ මුවන් 27ක් අල්ලා උඩවලව ජාතික උද්‍යානයට මුදා හැරීම සිදුකර ඇත. |
| 5. | **තොරතුරු හා සන්නිවේදන පද්ධතිය වැඩිදියුණු කිරීම.**<br><br><br>ගුවන් විදුලි සන්නිවේදන ජාලය නඩත්තු කිරීම | **2.0** | **1.43** | • ප්‍රධාන කාර්යාලය සහ ක්ෂේත්‍ර කාර්යාල සඳහා දුරකථන 25ක් මිල දී ගන්නා ලදී.<br>• ජාතික උද්‍යානයන් වල ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය සහ දෙපාර්තමේන්තුවේ පරිගණක ජාලය සහ ගුවන් විදුලි සන්නිවේදන ජාලය නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම සිදු කරමින් පවතී. |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **6.** | **මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය**<br><br> | **14.5** | **11.35** | • කුමන, වස්ගමුව, යාල සහ උඩවලව ජාතික උද්‍යාන වල කි.මී. 47ක් දිග මාර්ග පද්ධතියක් වැඩිදියුණු කිරීම සිදු කර ඇත.<br>• සපත්තු පාලම් 02ක් ඉදිකර ඇත.<br>• වස්ගමුව සහ විල්පත්තු ජාතික උද්‍යාන වල කි.මී.5ක් දිග මාර්ග අළුතින් ඉදිකර ඇත. |
| **7.** | **ජලාශ හා දියවලවල් ප්‍රතිසංස්කරණය කිරීම**<br> | **11.0** | **4.6** | • විල්පත්තුව ජාතික උද්‍යානයේ වැව් 03ක් ප්‍රතිසංස්කරණය සිදු කර ඇති අතර වැව් 04ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් පවතී. |
| **8.** | **ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම**<br><br>වව්නියාව වනජීවී පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම | **29.45** | **24.37** | • රක්ෂිත ප්‍රදේශවල පරිපාලන ගොඩනැගිලි සහ නිල නිවාස ඇතුළුව ගොඩනැගිලි 28ක්, ජල සැපයුම් පද්ධති 6ක් සහ විදුලි සැපයුම් පද්ධති 03ක් ප්‍රතිසංස්කරණය කිරීම අවසන් කර ඇත.<br>• යාල ජාතික උද්‍යානයේ ජල ටැංකිය ඉදි කිරීම සහ වනජීවී ප්‍රධාන කාර්යාලයේ ඉතිරි වැඩ අවසන් කරන ලදී. |
| **9.** | **ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම**<br> | **4.0** | **3.97** | • ඡායාරූප පිටපත් යන්ත්‍ර 05ක් පරිගණක 14ක් සහ එහි උපාංග, මුද්‍රණ යන්ත්‍ර 07ක් විවිධ වර්ගයේ පුටු 80ක්, ලැප්ටොප් පරිගණක 01ක්, ෆැක්ස් යන්ත්‍ර 01ක්, අල්මාරි 01ක්, සිතියම් රඳවන 05ක්, වායුසමීකරණ 03ක් මිලදී ගැනීම.<br>• මාදුරුඔය වනජීවී සංචාරක නිවාසය සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම අවසන් කර ඇත. |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **10.** | **යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම** | **3.35** | **1.23** | • ගල්ඔය ජාතික උද්‍යානය සඳහා බෝට්ටුවක් මිල දී ගන්නා ලදී.<br>• රක්ෂිත ප්‍රදේශවල රාජකාරී කටයුතු සඳහා යතුරු පැදි 04ක් මිලදී ගන්නා ලදී. |
| **11.** | **වාසස්ථාන සුපෝෂණය**<br><br> | **7.5** | **7.5** | • උඩවලව සහ ලුණුගම්වෙහෙර ජාතික උද්‍යාන වල වාසස්ථාන සුපෝෂණය යටතේ හෙක්ටයාර 118ක ආක්‍රමණශීලී ශාක ඉවත් කරනු ලැබීය.<br>• කුමන ජාතික උද්‍යානයේ කි.මී.10 ක් දිග මාර්ග දෙපස යටි පදුරු ඉවත් කිරීම අවසන් කර ඇත.<br>• උඩවලව ජාතික උද්‍යානයේ සහ වික්ටෝරියා, රන්දෙනිගල, රංටැඹේ කි.මී.37 ක් දිග ගිනි පටි නඩත්තු කටයුතු අවසන් කර ඇත. |
| **12.** | **පුහුණු හා පර්යේෂණ**<br> | **2.0** | **1.9** | • දෙපාර්තමේන්තු පර්යේෂණ යෝජනා යටතේ පර්යේෂණ 09ක් සිදුකොට අවසන් කර ඇත.<br>• පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 60ක්, රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 14ක් සහ වනජීවී කලාපවල වනජීවී ප්‍රදර්ශන 32ක් පවත්වා අවසන් කර ඇත.<br>• වනජීවී නිලධාරීන් 250ක් සඳහා බෝට්ටු පැදවීම, GPS භාවිතය, ගිනි අවි භාවිතය,නීති ක්‍රියාත්මක කිරීම, අලුතින් බඳවා ගන්නා ලද වනජීවී අඩවි ආරක්ෂක නිලධාරීන් සඳහා සමාරම්භක පුහුණු පාඨමාලාවන් පවත්වා ඇත.<br>• නිලධාරීන් දෙදෙනකුට පශ්චාත් උපාධි හැදෑරීම සඳහා පහසුකම් සලසා ඇත.<br>• දෙමළ භාෂා පුහුණුව 1 ප්‍රධාන කාර්යාලීය නිලධාරීන් 25ක් සඳහා ආරම්භ කර ඇත. |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 13. | **සංරක්ෂණ අධ්‍යාපනය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**<br><br>ගොවිජන උද්‍යානය පුවත්පත | 3.75 | 3.69 | • ලෝක පරිසර දිනය, ජෛව විවිධත්ව දිනය, තෙත් බිම් දින සැමරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 14ක් වනජීවී කලාප වල පවත්වන ලදී.<br>• පාසල් ළමුන්, රාජ්‍ය නිලධාරීන් ඇතුළුව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 100ක් පවත්වා අවසන් කර ඇත.<br>• මසුන් පිළිබඳව අධ්‍යාපනික පෝස්ටර් 5,000ක් මුද්‍රණය කිරීම සිදුකරමින් පවතී.<br>• වනන්තරේ කතන්දරේ වැඩසටහන ගුවන් විදුලි සංස්ථාව මගින් ප්‍රචාරය කරන ලද අතර ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය මගින් පළ කරන ගොවිජන උද්‍යානය නම් පුවත්පත පළ කිරීම සඳහා දායකත්වය සපයන ලදී. |
| 14. | **ආරක්ෂාව හා නීතිය ක්‍රියාත්මක කිරීම.** | 6.1 | 6.08 | • දකුණු ආසියානු කලාපයේ වනජීවී නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අන්තර් ජාතික සමුළුව සාර්ථක ලෙස 2012.06.03 දින කොළඹදී පවත්වනු ලැබීය.<br>• GPS හා චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරීන් 50ක් දැනුවත් කිරීම සඳහා වැඩමුළු 02ක් පවත්වන ලදී . |
| 15. | **ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය පවත්වාගෙන යාම.**<br><br>ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය - ගිරිතලේ | 8.00 | 7.98 | • වනජීවී කළමනාකරණය පිළිබඳව ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ සහතික පත්‍ර පාඨමාලාවන් 02ක් ගිරිතලේ ජාතික වනජීවී පුහුණු හා පර්යේෂණ කේන්ද්‍රයේදී වනජීවී නිලධාරීන්ගේ හැකියා වර්ධනය සඳහා පවත්වනු ලැබීය.<br>• රාජ්‍ය නිලධාරීන් සහ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ කෙටිකාලීන වැඩසටහන් 08ක් පවත්වනු ලැබීය. |
| 16. | **වාහන අළුත්වැඩියාව.** | 7.0 | 6.75 | • දෙපාර්තමේන්තුවේ සහ ක්ෂේත්‍ර කාර්යාලවල වාහන අළුත්වැඩියා කටයුතු සිදුකර ඇත. |

## වනජීවී සංරක්ෂණ අරමුදල

වනජීවී සංරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇත්තේ වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේය. මෙම අරමුදලේ අරමුණ වන්නේ වනජීවී සංරක්ෂණ කටයුතු වලින් ලැබෙන ආදායම් වලින් කොටසක් වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා යොදාගැනීමය. මෙම අරමුදලේ ආදායම් ලෙස සංචාරක කටයුතු වලින් ලැබෙන ආදායමින් කොටසක්, වනජීවී අපරාධ වලට එරෙහි නීතිමය කටයුතු වලින් ලැබෙන දඩ මුදල්, දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන වෙනත් සේවා වලින් ලැබෙන ආදයම් හා පරිත්‍යාග ද ඇතුළත් වේ.

## වනජීවී සංරක්ෂණ අරමුදලේ ප්‍රගතිය (2012 .12.31 දිනට )

| මූල්‍ය ප්‍රභවය | ඇස්තමේන්තුව (රු. මි.) | වියදම (රු. මි.) | (%) |
|---|---|---|---|
| වනජීවී සංරක්ෂණ අරමුදල | 510.0 | 406.0 | 79.6% |

### වනජීවී සංරක්ෂණ අරමුදලේ ආදායම (2012.12.31 දිනට)

| මාසය | ආදායම (රු. මි.) |
|---|---|
| ජනවාරි | 65.9 |
| පෙබරවාරි | 68.7 |
| මාර්තු | 62.9 |
| අප්‍රේල් | 51.8 |
| මැයි | 28.5 |
| ජූනි | 30.3 |
| ජූලි | 69.7 |
| අගෝස්තු | 94.0 |
| සැප්තැම්බර් | 52.0 |
| ඔක්තෝම්බර් | 52.1 |
| නොවැම්බර් | 56.9 |
| දෙසැම්බර් | 69.6 |
| **එකතුව** | **702.4** |

### ජාතික උද්‍යානවලට සංචාරකයින්ගේ පැමිණීම (2012.12.31 දිනට)

| ජාතික උද්‍යානය | දේශීය | විදේශීය |
|---|---|---|
| යාල | 217,898 | 121,735 |
| හෝටන්තැන්න | 184,744 | 39,123 |
| උඩවලව | 52,995 | 23,082 |
| වස්ගමුව | 22,891 | 812 |
| මින්නේරිය | 37,833 | 25,020 |
| බුන්දල | 6,397 | 4,853 |
| හොරගොල්ල | 6,637 | 2 |
| කවුඩුල්ල | 8,930 | 6,443 |
| ලුණුගම්වෙහෙර | 3,115 | 48 |
| ගල්ඔය | 2,523 | 332 |
| කුමන | 18,644 | 1,958 |
| අංගම්මැඩිල්ල | 1,536 | - |
| ගැල්වේස්ලැන්ඩ් | 1,521 | 82 |
| විල්පත්තුව | 29,689 | 5,417 |
| මාදුරුඔය | 716 | 21 |
| ලාහුගල | 314 | 110 |
| පරෙවි දූපත | 36,646 | 8,437 |
| හික්කඩුව | 40,506 | 7,050 |
| උඩවලව ඇත් අතුරු සෙවන | 106,176 | 9,527 |
| **එකතුව** | **779,711** | **254,052** |

## සමස්ත මූල්‍ය ප්‍රගතිය (2012.12.31 දිනට)

| වියදම් ඛාණ්ඩය | ඇස්තමේන්තුව (රු.මි.) | වියදම (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| මූලධන වියදම් | 648.2 | 424.2 | 65% |
| පුනරාවර්තන වියදම් | 483.1 | 481.6 | 99% |
| එකතුව | 1131.3 | 905.8 | 80% |

# ජාතික පොහොර ලේකම් කාර්යාලය

# ජාතික පොහොර ලේකම් කාර්යාලය

## දැක්ම

"ශ්‍රී ලංකාවේ වගා කරන සියලු බෝග වල නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කාබනික හා අකාබනික පොහොර නියමිත ප්‍රමිතියෙන් යුතුව නියමිත වේලාවට සම්පාදනය තහවුරු වී තිබීම."

## මෙහෙවර

"පොහොර විධිමත් කිරීමේ පනතේ විධිවිධාන අනුව අදාළ සියලු පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් විද්‍යානුකූල නිර්දේශයන් මත පොහොර අවශ්‍යතාවය තක්සේරු කිරීම, පොහොර ආනයන හා තොග පාලනය, නිසි ගුණාත්මක බවින් යුතු පොහොර බෙදාහැරීම හා අලෙවිය තහවුරු කිරීම, කාබනික පොහොර හා අකාබනික පොහොර භාවිතයේදි පරිසර හිතකාමී ලෙස පොහොර භාවිතය වැඩිදියුණු කිරීම, ගොවිප්‍රජාවගේ අදායම ඉහළ නැංවීමේ අරමුණින් යුතුව පොහොර සහනාධාර යෝජනා ක්‍රම මෙහෙයවීම හා පොහොර භාවිත ක්ෂේත්‍රයේ අක්‍රමිකතාවයන් වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම."

## සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය - 2012

### 2012.12.31 දිනට ප්‍රගතිය

### 1. ප්‍රතිපත්ති, ආයතනික සම්බන්ධීකරණ සහ බලපත්‍ර අංශය

| ආනයනය | | | | සකස් කිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| නව බලපත්‍ර | | අලුත් කිරීම් | | නව බලපත්‍ර | | අලුත් කිරීම් | |
| ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| - | 08 | 61 | 53 | - | 04 | 25 | 18 |

| නිෂ්පාදනය | | | | බෙදාහැරීම සහ අලෙවි කිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| නව බලපත්‍ර | | අලුත් කිරීම් | | නව බලපත්‍ර | | අලුත් කිරීම් | |
| ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| - | 02 | 02 | 01 | - | 135 | - | 19 |

- ජාතික පොහොර ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ සහභාගිත්වය පහත සඳහන් ප්‍රධාන කමිටු හා රැස්වීම් සඳහා ලබා දී තිබේ.

| කමිටුව / රැස්වීම | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ නිලධාරින් සහභාගි වූ අවස්ථා ගණන |
|---|---|
| දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව | 225 |
| දිස්ත්‍රික් පොහොර කමිටුව | 62 |
| ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව | 345 |
| ගොවිජන සේවා කමිටුව | 280 |
| ප්‍රාදේශීය නිලධාරී රැස්වීම් | 256 |
| කෘෂිකර්ම උපදේශන කමිටුව | 128 |

## 2. තාක්ෂණික හා ආර්ථික විශ්ලේෂණ අංශය

- **පොහොර තත්ත්ව හා විශ්ලේෂණ වැඩසටහන්**

එක් එක් රසායනාගාරය මගින් විශ්ලේෂණය කරන ලද සාම්පල් ප්‍රමාණය පහතින් දක්වා ඇත.

| මාසය | ITI | SLSI | SGS | B&B | එකතුව |
|---|---|---|---|---|---|
| ජනවාරි | 33 | - | 36 | 6 | 75 |
| පෙබරවාරි | 26 | - | 6 | 24 | 56 |
| මාර්තු | 27 | - | 26 | 6 | 59 |
| අප්‍රේල් | 20 | - | 12 | 3 | 35 |
| මැයි | 29 | - | 12 | 9 | 50 |
| ජූනි | 17 | 13 | 9 | 3 | 42 |
| ජූලි | 20 | 13 | 10 | 19 | 62 |
| අගෝස්තු | 13 | 3 | 21 | 40 | 77 |
| සැප්තැම්බර් | 21 | 12 | 22 | 32 | 87 |
| ඔක්තෝම්බර් | 48 | 7 | - | - | 55 |
| නොවැම්බර් | 4 | - | 20 | 8 | 32 |
| දෙසැම්බර් | 56 | - | 9 | 17 | 82 |
| **එකතුව** | **314** | **48** | **183** | **167** | **712** |

ITI - කාර්මික තාක්ෂණික ආයතනය, SLSI - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, SGS - Society General Surveillance, B&B - Bamber & Bruce

- **තත්ත්ව විශ්ලේෂණය කරන ලද පොහොර ප්‍රමාණය (මෙ.ටො)**

| පොහොර වර්ගය | එකතුව |
|---|---|
| යූරියා | 396,888.80 |
| මියුරියේට් ඔෆ් පොටෑෂ් | 144,676.74 |
| ත්‍රිත්ව සුපිරි පොස්පේට් | 109,708.41 |
| තනි සුපිරි පොස්පේට් | - |
| ඇමෝනියම් සල්පේට් | 74,334.05 |
| කීසරයිට් | 10,517.87 |
| සින්ක් සල්පේට් | 1,438.00 |
| ඩයි ඇමෝනියම් පොස්පේට් | 4,576.08 |
| කැල්සියම් ඇමෝනියම් නයිට්‍රේට් | 100.00 |
| එප්සම් සෝල්ට් | 784.27 |
| පොටෑසියම් සල්පේට් | 332.99 |
| කැල්සියම් නයිට්‍රේට් | 337.00 |
| මුහුදු පැළෑටි නිස්සාරකය (ලීටර්) | 4,520.60 |
| මුහුදු පැළෑටි නිස්සාරකය | 10.01 |
| දියර පොහොර | 241,221.80 |
| මිශ්‍ර පොහොර | 4,879.25 |

## 3. පොහොර අවශ්‍යතාවය හඳුනාගැනීමේ හා බෙදාහැරීමේ අංශය

2011/ 2012 මහ කන්නය හා 2012 යල කන්නය සඳහා වී වගා කරන භූමි ප්‍රමාණය හා පොහොර නිර්දේශ පදනම් කරගනිමින් පොහොර අවශ්‍යතාවය තක්සේරු කර බෙදාහැරීම අවසන් කර තිබේ.

**2012 / 2013 මහ කන්නය**

| කාරණය | මහා වාරිමාර්ග | සුළු වාරිමාර්ග | වර්ෂාපෝෂිත | එකතුව |
|---|---|---|---|---|
| වගා ඉලක්ක (හෙක්.) | 336,570 | 207,041 | 209,821 | 753,432 |

| කාරණය | යූරියා (මෙ.ටො.) | ටී.එස්.පී. (මෙ.ටො.) | එම්.ඕ.පී. (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) |
|---|---|---|---|---|
| පොහොර අවශ්‍යතාවය | 166,556.23 | 57,313.73 | 50,242.33 | 274,112.29 |
| පොහොර බෙදා හැරීම | 143,476.35 | 46,980.35 | 40,011.89 | 230,468.59 |

**2012 යල කන්නය**

| කාරණය | මහා වාරිමාර්ග | සුළු වාරිමාර්ග | වර්ෂාපෝෂිත | එකතුව |
|---|---|---|---|---|
| වගා ඉලක්ක (හෙක්.) | 302,175 | 151,965 | 82,820 | 536,960 |

| කාරණය | යූරියා (මෙ.ටො.) | ටී.එස්.පී. (මෙ.ටො.) | එම්.ඕ.පී. (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) |
|---|---|---|---|---|
| පොහොර අවශ්‍යතාවය | 130,154.75 | 44,438.70 | 40,680.98 | 215,274.43 |
| පොහොර බෙදා හැරීම | 90,868.10 | 29,761.57 | 26,050.24 | 146,679.91 |

රජයේ ගොවිපළ හා රාජ්‍ය ආයතන සතු කුඹුරු ඉඩම් වල වී වගාව සඳහා ද සහනාධාර මත පොහොර සැපයීම සිදු කරනු ලැබේ.

**2012 යල කන්නය**

| වගා ඉලක්ක (හෙක්.) | යූරියා (මෙ.ටො.) | ටී.එස්.පී. (මෙ.ටො.) | එම්.ඕ.පී. (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) |
|---|---|---|---|---|
| 1,161.10 | 229.25 | 75.70 | 65.87 | 370.82 |

**2012/2013 මහ කන්නය**

| වගා ඉලක්ක (හෙක්.) | යූරියා (මෙ.ටො.) | ටී.එස්.පී. (මෙ.ටො.) | එම්.ඕ.පී. (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) |
|---|---|---|---|---|
| 3,317.95 | 808.35 | 278.05 | 219.00 | 1,305.40 |

| කාරණය | යූරියා (මෙ.ටො.) | ටී.එස්.පී. (මෙ.ටො.) | එම්.ඕ.පී. (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) |
|---|---|---|---|---|
| 2012 යල කන්නය | 90,868.10 | 29,761.57 | 26,050.24 | 146,679.91 |
| 2012/2013 මහ කන්නය | 143,476.35 | 46,980.35 | 40,011.89 | 224,468.59 |

## 4. පොහොර ආනයන, තොග පාලනය හා සහනාධාර පරිපාලන අංශය

- රාජ්‍ය පොහොර සමාගම් සතු තොග තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

| කාරණය | යූරියා (මෙ.ටො.) | ටී.එස්.පී. (මෙ.ටො.) | එම්.ඕ.පී. (මෙ.ටො.) |
|---|---|---|---|
| 2012.01.01 දිනට පැවති තොග තත්ත්වය | 62,424.91 | 32,058.93 | 38,272.46 |
| 2012 වසරේ සැප්තැම්බර් දක්වා ආනයනය | 286,831.19 | 80,374.37 | 60,838.88 |
| 2012.12.31 දක්වා බෙදාහැරීම් | 269,475.26 | 88,652.99 | 75,964.89 |
| 2012.12.31 දිනට තොග තත්ත්වය | 79,780.84 | 23,780.31 | 23,146.45 |

- පෞද්ගලික පොහොර සමාගම් සතු තොග තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

| කාරණය | යූරියා (මෙ.ටො.) | ටී.එස්.පී. (මෙ.ටො.) | එම්.ඕ.පී. (මෙ.ටො.) |
|---|---|---|---|
| 2012.01.01 දිනට පැවති තොග තත්ත්වය | 32,168.51 | 4,658.53 | 29,223.24 |
| 2012 වසරේ නොවැම්බර් දක්වා ආනයනය | 155,462.91 | 30,172.70 | 85,272.93 |
| 2012.11.30 දක්වා බෙදාහැරීම් | 159,514.34 | 30,813.77 | 90,745.67 |
| 2012.11.30 දිනට තොග තත්ත්වය | 4,435.21 | 1,956.93 | 5,623.05 |

- පොහොර සහනාධාර වැඩසටහන යටතේ ගෙවීම් විස්තර පහත දක්වා ඇත.

| කාරණය | 2012.12.31 දිනට ගෙවන ලද මුදල (රු.මි.) |
|---|---|
| වී පොහොර සහනාධාරය සඳහා | 20,165.95 |
| තේ පොහොර සහනාධාරය සඳහා | 2,181.31 |
| පොල් පොහොර සහනාධාරය සඳහා | 625.60 |
| වෙනත් කෘෂි හා වැවිලි බෝග සඳහා | 13,483.44 |
| **එකතුව** | **36,456.30** |

- පොහොර ප්‍රසම්පාදනයට අදාළව පහත සඳහන් කමිටු රැස්වීම් පවත්වා සිය කාර්යභාරය ඉටු කර ඇත.

| කමිටුව | රැස්වීම් ගණන |
|---|---|
| අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන සැලසුම් කමිටුව | 09 |
| එක් එක් කාර්තුව සඳහා පොහොර වාණිජ මිල තීරණය කිරීමේ කමිටුව | 04 |

- 2013 වර්ෂය සඳහා ආනයනය කිරීමට සැලසුම් කරන ලද පොහොර පංගු (Quota) පහත දැක්වේ.

| කාරණය | යූරියා (මෙ.ටො.) | ටී.එස්.පී. (මෙ.ටො.) | එම්.ඕ.පී. (මෙ.ටො.) |
|---|---|---|---|
| වාර්ෂික පොහොර අවශ්‍යතාවය | 508,250.00 | 143,500.00 | 233,500.00 |

- 2013 වර්ෂය සඳහා පොහොර සහනාධාරය වෙනුවෙන් ඇස්තමේන්තු කරන ලද මුදල රු.මී. 70,000.00කි.

- ප්‍රසම්පාදනයට අදාල පහත සඳහන් කමිටු 2013 වර්ෂයේ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

| කමිටුව | රැස්වීම් ගණන |
|---|---|
| අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන සැලසුම් කමිටුව | 09 |
| එක් එක් කාර්තුව සඳහා පොහොර වාණිජ මිල තීරණය කිරීමේ කමිටුව | 04 |

## 5. නෛතික හා විමර්ශන අංශය

- පොහොර ආනයන අවස්ථා 704 ක තත්ත්ව පරීක්ෂාව.
- ආනයනය කරන ලද දියර පොහොර හා මිශ්‍ර පොහොර වර්ග කීපයක සංයුතිය නිවැරදිව නිරූපණය වන පරිදි තොරතුරු ප්‍රදර්ශනය කරමින් අලෙවි කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත. එවැනි පොහොර ආනයන අවස්ථා 54 ක් සම්බන්ධයෙන් මෙම ක්‍රියාමාර්ගය ගෙන තිබේ.
- පොහොර භාවිත ක්ෂේත්‍රයේ සිදු විය හැකි දූෂණ හා අක්‍රමිකතා අවම කිරීම අරමුණු කර ගනිමින් පොළොන්නරුව, අනුරාධපුරය, මාතලේ, රත්නපුර, මාතර, ගාල්ල, කුරුණෑගල, ගම්පහ,නුවර එළිය හා කළුතර යන දිස්ත්‍රික්කයන්හි විමර්ශන කටයුතු සිදු කළ අතර ගොවිජන සේවා මධ්‍යස්ථාන 147 ක් ද, පොහොර සමාගම් වල බලයලත් නියෝජිත ආයතන 197ක් ද නිරීක්ෂණය කර ආනයන 8 කට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත.
- පොහොර විධිමත් කිරීමේ පනතේ විධිවිධාන පිළිබඳව මහජනතාව හා නිලධාරීන් දැනුවත් කිරීම පිණිස පුහුණු වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කර තිබේ. ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමට විශේෂ අවධානය යොමු කර ඇත.

**කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරිමේ වැඩසටහන**

## 2012.12.31 දිනට ප්‍රගතිය

| ක්‍රියාකාරකම | අනුරාධපුරය | | පොළොන්නරුව | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| ලියාපදිංචි වී ඇති කාබනික පොහොර නිෂ්පාදන ඒකක සංඛ්‍යාව | 650 | 694 | 300 | 198 |
| ලියාපදිංචි වී ඇති කාබනික පොහොර නිෂ්පාදකයින් | 19,500 | 20,820 | 7,500 | 2,470 |
| කාබනික පොහොර නිෂ්පාදකයින් වෙත බෙදා දී ඇති කෘෂිකාර්මික උපකරණ කට්ටල සංඛ්‍යාව | 20,000 | 26,500 | 8,000 | 3,470 |
| කාබනික පොහොර නිෂ්පාදන සඳහා බෙදා දී ඇති | 650 | 600 | 300 | 198 |
| සපයා ඇති තහඩු සෙවිලි කළ මඩු සංඛ්‍යාව * | 650 | 155 | 300 | - |
| බෙදා දී ඇති එප්පාවල රොක් පොස්පේට් ප්‍රමාණය (මෙ.ටො.) * | 1,000 | 202.5 | 400 | - |
| බෙදා දී ඇති පොලිතින් ප්‍රමාණය (කි.ග්‍රෑ.) ** | 70,000 | 17,500 | 28,000 | 2,500 |
| පවත්වා ඇති පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 40 | 44 | 11 | 14 |
| 2012 / 2013 මහ කන්නය සඳහා නිෂ්පාදනය කෙරෙන කාබනික පොහොර ප්‍රමාණය (මෙ.ටො.) | 20,000 | 20,000 | 8,000 | 1,900 |
| ප්‍රතිලාභී වී ගොවීන් සංඛ්‍යාව | 130,000 | - | 50,000 | - |

- තවදුරටත් ක්‍රියාත්මක කරමින් පවතී.

# ශ්‍රී/ස. ලංකා පොහොර සමාගම

# සී/ස. ලංකා පොහොර සමාගම

## දැක්ම

“ශ්‍රී ලාංකික පොහොර වෙළඳපල නියමුවා ලෙස කෘෂි ක්ෂේත්‍රය හා ඒ ආශ්‍රිත නව නිපැයුම්, සේවා හා යෙදවුම් සපයන විවිධාංගීකරණය වූ නව ලොවට ගැළපෙන ප්‍රමුඛතම ආයතනය වීම.”

## මෙහෙවර

“රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව ලක්පොහොර පවුලේ උපරිම දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා ගොවිජන සේවා ක්ෂේත්‍රයේ නිෂ්පාදනය, ආදායම හා ලාභදායීත්වය වැඩිකිරීම සඳහා බහුවිධ වෙළඳපල ඉල්ලුමට සරිලන පොහොර නිෂ්පාදනය හා අලෙවිය තුළින් සමාගමේ ලාභදායී තිරසාර පැවැත්ම තහවුරු කිරීම.”

# 2012 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්

- **පොහොර ගබඩාවක් ඉදිකිරීම**




ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීම තුළින් වර්ග අඩි 537ක භූමිභාගයක් තුළ මෙ.ටො.1500ක ධාරිතාවයෙන් යුත් පොහොර ගබඩාවක් කළුතර දිස්ත්‍රික්කයේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පැලවත්ත ප්‍රදේශයේ රු. 371,685ක වියදමින් ඉදිකරන ලදී.

- **නිවාඩු නිකේතනය ප්‍රතිසංස්කරණය**

පොළොන්නරුව ප්‍රදේශය ආගමික හා පාරිසරික අතින් ප්‍රසිද්ධියට හිමිකම් කියන ස්ථානයක් බැවින් දේශීය හා විදේශිය සංචාරකයින් සඳහා පහසුකම් සපිරි සංචාරක බංගලා 3ක් පොළොන්නරුව ප්‍රාදේශීය ගබඩා සංකීර්ණයේ රු.මි. 4.1ක වියදමින් ප්‍රතිසංස්කරණය කරන ලදී.







## 2012.12.31 දිනට සහනාධාර පොහොර වැඩසටහනේ ප්‍රගතිය

| ප්‍රතිපාදන (රු.මි.) සහනාධාර වටිනාකම | මූල්‍ය ඉලක්කය | මූල්‍යමය | | වාර්ෂික භෞතික ඉලක්කය (මෙ.ටො.) | 2012.12.31ට භෞතික ඉලක්කය (මෙ.ටො.) | භෞතික | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රගතිය (රු.මි.) | % | | | ප්‍රගතිය (මෙ.ටො.) | % |
| 2,061.61 | 2,061.61 | 1,987.87 | 96 | 294,515 | 294,515 | 283,982 | 96 |

## වී සහනාධාර පොහොර අලෙවිය

- වී පොහොර සහනාධාරය යටතේ 2011 / 2012 වසර සඳහා පොහොර මෙ.ටො. 306,691 ක ප්‍රමාණයක අලෙවියක් සිදු කරනු ලැබීය.

- 2011.05.26 දින හඳුන්වා දුන් අනෙකුත් සියළුම භෝග සඳහා සහනාධාර පොහොර ලබාදීමේ වැඩපිළිවෙල යටතේ රජයේ සහ පෞද්ගලික අංශයේ අවශ්‍යතාවයන්ට අනුව පොහොර ලබාදෙමින් තරගකාරී වෙළඳපළ තුළ ක්‍රියාතමක වී විශාල වෙළඳපළ කොටසක් අත්පත් කර ගැනීමට ආයතනයට හැකිවී ඇත. 2011 /2012 මූල්‍ය වර්ෂය සඳහා මෙ.ටො. 23,656 ක ප්‍රමාණයක් අලෙවි කර ඇත. මෙම අලෙවිය පසුගිය වසරට සාපේක්ෂව 326%ක වර්ධනයකි.

## 2012.12.31 දිනට සහනාධාර පොහොර බෙදාහැරීම

| දිස්ත්‍රික්කය | ගබඩා | (මෙ.ටො.) |
|---|---|---:|
| කොළඹ | හුණුපිටිය | 14 565.86 |
| කළුතර | දොඩංගොඩ | 313.30 |
| | පැලවත්ත | 128.85 |
| | මතුගම | 746.73 |
| නුවර | ගම්පොළ | 178.30 |
| | කඩුගන්නාව | 6.50 |
| මාතලේ | දඹුල්ල | 438.56 |
| | මාතලේ | 633.45 |
| | නාගොල්ල | 887.60 |
| නුවරඑළිය | නුවරඑළිය | 389.90 |
| | රිකිල්ලගස්කඩ | 792.20 |
| ගාල්ල | කොග්ගල | 575.15 |
| මාතර | අකුරැස්ස | 1 104.75 |
| | මැදවියන්ගොඩ | 1 125.75 |
| හම්බන්තොට | බටඅත | 1 396.35 |
| | දෙහිගහලන්ද | 1 389.20 |
| | වීරවිල | 5 003.80 |
| | වීරකැටිය | 2 022.75 |
| | සූරියවැව | 2 807.10 |
| කුරුණෑගල | කුරුණෑගල | 1 452.40 |
| | මහව | 1 969.70 |
| | පොල්ගහවෙල | 1 417.35 |
| | සඳලංකා | 1 375.80 |
| | කුලියාපිටිය | 1 572.35 |
| පුත්තලම | නාත්තන්ඩිය | 729.89 |
| | ආනමඩුව | 1 281.35 |
| රත්නපුර | කුරුවිට | 508.30 |
| | ඇඹිලිපිටිය | 3 116.60 |
| කෑගල්ල | කෑගල්ල | 568.35 |
| බදුල්ල | බදුල්ල | 497.30 |
| | බන්ඩාරවෙල | 90.00 |
| | වැලිමඩ | 762.25 |
| | මහියංගනය | 5 414.44 |
| මොණරාගල | මොණරාගල | 2 335.30 |
| | වැල්ලවාය | 1 024.65 |
| | බිබිල | 509.35 |
| අනුරාධපුරය | රක්වාන | 1 224.95 |
| | නොච්චියාගම | 3 398.00 |
| | තලාව | 4 197.15 |
| | හොරොව්පතාන | 2 168.65 |
| | පදවිය | 1 830.50 |
| | මැදවච්චිය | 4 035.35 |
| පොළොන්නරුව | පොළොන්නරුව | 9 044.75 |
| | මැදිරිගිරිය | 4 206.70 |
| | වැලිකන්ද | 3 738.50 |
| | හිඟුරක්ගොඩ | 2 861.15 |
| මඩකලපුව | මඩකලපුව | 4456.50 |
| අම්පාර | අම්පාර | 4976.05 |
| | සමන්තුරේ | 3933.85 |
| | පොතුවිල් | 847.60 |
| | අක්කරෙයිපත්තුව | 1 883.95 |
| | දෙහිඅත්තකන්ඩිය | 2 306.06 |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | 1931.35 |
| | කන්තලේ | 1 959.40 |
| යාපනය | කොන්ඩවිල් | 895.55 |
| මුලතිව් | ඔලුමඩු | 1 938.25 |
| | | **120 965.74** |

## ආයතනික ප්‍රගතිය

- සමාගමේ හුණුපිටිය ගබඩා සංකීර්ණය හා ප්‍රධාන කාර්යාලය පිහිටි අක්කර 22 ක ඉඩම අතිගරු ජනාධිපතිතුමාගේ නිදහස් දීමනා බලපත්‍රයක් මඟින් සමාගම වෙත පවරා ගැනීම සිදු කර ඇත.
- සී/ස. ලංකා පොහොර සමාගම රාජ්‍ය ව්‍යවසාය ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාපරිපාටිය යටතේ 2011.04.29 දින සිට බල පැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරය මගින් C කාණ්ඩයේ සිට B කාණ්ඩයට උසස් කර ඇත.
- "ලක්පොහොර" නාමය හා ලාංඡනය නිල වශයෙන් බුද්ධිමය දේපල කාර්යාලයේ ලියාපදිංචි කර "නාමය" හා "ලාංඡන" අයිතියද තහවුරු කර ඇත.
- සමාගමෙහි 2011-2015 දක්වා සංයුක්ත සැලැස්ම සහ 2011 - 2013 දක්වා වූ ක්‍රියාකාරී සැලැස්ම සකස්කොට ක්‍රියාත්මක කරමින් පවතී.
- වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කර ඇත.
- වාර්ෂික විගණන සැලැස්ම සකස්කොට ක්‍රියාත්මක කිරීම.
- විගණනය කරන ලද ගිණුම් වාර්තා අදාළ ආයතන වෙත ලබාදීම මෙන්ම 2012.03.31න් අවසන් වාර්ෂික වාර්තාවද මේ වන විට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
- සමාගමේ සේවක සංඛ්‍යා සංයුතිය මෙන්ම බඳවා ගැනීමේ පරිපාටියට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත. එමෙන්ම සියළුම බඳවා ගැනීම් හා උසස්වීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව සිදුවේ.
- සමාගමේ සේවා හා පරිපාලන කටයුතු සඳහා අන්තර්ජාතික ISO 9001:2008 තත්ත්ව සහතිකය හිමිකරගෙන ඇත.



- සමාගමේ සේවක හවතුන්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා පංචවිධ සංකල්පය ඇතුළු ඵලදායිතා සංකල්ප ප්‍රමුඛ කරගත් ඵලදායිතා වැඩසටහනක් සෑම අංශයක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කර ඇත. (2012 ඵලදායිතා සම්මාන සඳහා ආයතනය දැනට ක්‍රියා කරමින් සිටී.
- සමාගම සතු රසායනාගාරය ජාත්‍යන්තර මට්ටමේ සහතික ලත් මධ්‍යගත රසායනාගාරයක් බවට පරිවර්තනය කිරීමේ කටයුතු මේ වන විට සිදු කර ඇති අතර ඒ සඳහා ISO/IEC 17025:2005 ජාත්‍යන්තර තත්ත්ව සහතිකය ලබා ගෙන ඇත. එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිතන මණ්ඩලය පිළිගත් පොහොර සම්බන්ධ පරීක්ෂණ සිදු කල හැකි ලංකාවේ රාජ්‍ය ආයතන තුන අතරට එක්වීමේ අවස්ථාව හිමි කරගෙන ඇත. (SLSI, ITI, CFC)



- 2007 වර්ෂය වන විට සෘණ මිලියන 330ක ශුද්ධ වගකීමක් ලෙස පැවති ලංකා පොහොර සමාගම 2011/2012 වසර වන විට ශුද්ධ වත්කම් රුපියල් මිලියන 543 ක ධන අගයක් දක්වා වර්ධනය කර ගැනීමට හැකිවිය.

- 2009 වසරේ රු.මි. 03ක් ද , 2010 වසරේ රු.මි. 03ක් ද, 2011 වසරේ රු.මි. 09 බැගින්ද මහා භාණ්ඩාගාරය වෙත ලාභාංශ ගෙවා ඇත.

- 2009 - 2010 වර්ෂයේ සිට 2011 - 2012 වර්ෂය දක්වා පිළිවෙලින් රු.මි.35, රු.මි.43.6, රු.මි. 50.2 ක් රජයට බදු වශයෙන් ගෙවා ඇත.

- ආයතනික ඉතිහාසයේ වැඩිම බදු පෙර ලාභය වශයෙන් රු.මි. 95ක් 2012 වර්ෂයේදී වාර්තා කොට ඇත.

- 2011 / 2012 ගිණුම් වර්ෂය තුලදී රුපියල් මිලියන 95.4 ක බදු පෙර ලාභයක් ලබමින් ආයතනික ඉතිහාසයේ වාර්තාගත වැඩිම බදු පෙර ලාභය සහටන් කිරීමට හැකිවිය. මීට පෙර ආයතනික වාර්තාව වූයේද 2010 / 2011 වසරේ වූ රුපියල් මිලියන 73.9 ක බදු පෙර ලාභයයි.

- හුණුපිටිය පොළොන්නරුව ප්‍රධාන ගබඩා සංකීර්ණය ඇතුළුව දිවයින පුරා ගබඩා 54 කින් සමන්විත ගබඩා ජාලයේ ධාරිතාව මෙ. ටො. 150,000 කි. දිවයින පුරා ස්ථාපිත කර ඇති ලක් පොහොර ගබඩා ජාලය මගින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 376කට නිකුත් කරන වී සහනාධාර පොහොර නිසි කලට ගොවිජනතාව වෙත ලබා දීමට කටයුතු කරනු ලබයි.

- පොළොන්නරුව ප්‍රාෙද්ශීය ගබඩා සංකීර්ණය තුළ දිගු කාළයක් භාවිතයට නොගෙන තිබූ ගොඩනැගිලි 04 ක් අවම පිරිවැයක් යටතේ සේවක හවතුන්ගේ ශ්‍රම දායකත්වය ඇතිව ප්‍රතිසංස්කරණය කර නිවාඩු නිකේතන 04 ක් බවට පත් කරන ලදී ආයතනයේ සේවක මණ්ඩලයට විිශේෂ සහන මිලකටද බාහිර පුද්ගලයන් වෙත වාණිජ ගාස්තු ක්‍රමයටද වෙන් කරවා ගැනීමේපහසුකම් සලසා ඇත. මෙයට ආයතනයට අමතර ආදායම් උපයන මාර්ගයකි.

- හරිත ඵලදායිතාවය සඳහා හුණුපිටිය කාර්යාල භූමියේ ඇති ලක් පොහොර ගොවිපළ සියලු අංගයන්ගෙන් සමන්විත කාබනික පොහොර පමණක් භාවිතා කරනු ලබන ආදර්ශ ගොවිපළක් ලෙස සංවර්ධනය කර පවත්වාගෙන යනු ලබයි.

- බලශක්ති පරිභෝජනය අවම කරගෙන ඒ තුළින් බලශක්තිය සංරක්ෂණය කිරීමට ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කර ඇත.

## අනෙකුත් බෝග සහනාධාර අලෙවිය

- රජයේ දිවිනැගුම ජාතික වැඩසටහනට සමගාමීව නාගරික ගෙවතු වගාවන් ඉලක්ක කර ගනිමින් 500gm ක ක්‍රඩා ඇසුරුම් පොහොර පැකට් ''mini pack'' නමින් හඳුන්වා දී ඇත. මේ වන විට සුපිරි වෙළඳසැල් වල හා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ ප්‍රදර්ශනාගාාර හා ඊට අනුබද්ධිත අලෙවිසැල් වලින් මෙන්ම ලක් පොහොර අලෙවි ජාලයෙන්ද මෙම ''mini pack'' මිලදී ගත හැක.

### මානව සම්පත් සුහසාධනය හා අභිප්‍රේරණය සඳහා ක්‍රියාත්මක වැඩසටහන්

- සේවක හවතුන් සඳහා ජාත්‍යන්තර සහතික ලත් පරිගණක ඩිප්ලෝමා පාඨමාලාවක් (ICDL) සඳහා ආයතනයේ මූල්‍ය අනුග්‍රහය දැක්වීම.
- සමාගමේ තොරතුරු තාක්ෂණ අංශයට අයත් නොවන තෝරාගත් අනෙකුත් අංශවල සේවක හවතුන් සඳහා පවත්වන ලද පරිගණක දෘඩාංග හා ජාලකරණ පිළිබද ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා පහසුකම් සැලසීම.
- ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය ගබඩා සංකීර්ණයේ සේවක හවතුන්ගේ ප්‍රවාහන කටයුතු පහසු කිරීම සඳහා කාර්යාලයීය ප්‍රවාහන පහසුකම් නොමිලේ සැපයීම.
- ඵලදායිතාවය හා ඵලදායිතා සංකල්පය පිළිබද වැඩමුළු පැවැත්වීම.
- රසායනික ද්‍රව්‍ය පරිහරණය හා රසායනික ද්‍රව්‍ය භාවිතයේදී ගතයුතු ආරක්ෂක පියවර පිළිබඳව පොහොර ආශ්‍රිත කටයුතු වල නියැලෙන සේවක හවතුන් දැනුවත් කිරීමේ වැඩමුළුවකට සහභාගි කරවීම.
- සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය මගින් පවත්වන ලද ගබඩා කරන පාඨමාලාව හා ශ්‍රී ලංකා පරිපාලන ආයතනය විසින් ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබද පවත්වන ලද සහතිකපත් පාඨමාලාවක් සඳහා ප්‍රසම්පාදන අංශයේ සේවක හවතුන් සහභාගි කරවීම.
- ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ ආයතනය විසින් සංවිධානය කරන ලද අන්තර්ජාතික වාර්ෂික මානව සම්පත් කළමනාකරණ සමුළුව නියෝජනය කිරිම සඳහා කළමනාකාරීත්වය නියෝජනය කරමින් මානව සම්පත් කළමනාකරු ඇතුළු කළමනාකරුවන් සහභාගී කරවීම.
- සමාගමේ සියළු විධායක ශ්‍රේණීන් හා කළමනාකාර ශ්‍රේණිවල සේවක හවතුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් වර්ධන කිරීම,ආකල්ප වර්ධනය කිරීම හා තීරණ ගැනීමේ හැකියාවන් වර්ධන කිරීමේ අරමුණින් දෙදිනක් පුරා නාඋල්ල ජාතික යොවුන් සේනාංක මධ්‍යස්ථානයේ "Out Bound Training" නේවාසික පුහුණු වැඩසටහනක් සඳහා සහභාගි කරවීම.

- මාර්ග නීති හා රථ වාහන කාර්මික නඩත්තු පිළිබඳ ප්‍රවාහන නිළධාරී හා රියැදුරු මහතුන් සඳහා එක් දින පුහුණු වැඩ සටහනක් විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති ටී.පෙරිම්පනාගම් මහතාගේ සම්පත් දායකත්වයෙන් ආයතන ශ්‍රවණාගාරයේදී පැවැත්වීම.
- ශ්‍රී ලංකා රේගුව විසින් පවත්වන ලද ආනයන හා නිෂ්කාශන නව ක්‍රම වේදයන් පිළිබඳව එක් දින වැඩමුලුවක් සඳහා ප්‍රසම්පාදන අංශයේ සේවක භවතුන් සහභාගි කරවීම.
- සමාගම විසින් සේවක භවතුන් සඳහා පොදු පුහුණු වැඩසටහන් හැරුණු විට ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රයන්හි වෙනත් වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කරවීම.
- වියත් දේශන සම්මන්ත්‍රණ මඟින් සේවක භවතුන්ගේ අධ්‍යාත්මික ගුණවගාව වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.
- සේවක භවතුන්ගේ කායික හා මානසික සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ අරමුණින් ශරීර සුවතා ඒකකයක් ස්ථාපිත කිරීම.
- සේවක භවතුන් සඳහා ක්‍රීඩා සංගමයක් පිහිටුවීමට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබා දීම.
- ආපදා අවස්ථාවලදී පීඩනයට ලක්වන සේවක භවතුන් සඳහා සහනයක් වීමට ''ආපදා අරමුදලක්'' පිහිටුවීම.
- සේවක භවතුන්ගේ දීර්ඝ කාලීන සේවා ඇගයීම සඳහා රන් පවුම් ප්‍රදානය කිරීම.
- සේවක භවතුන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතාව වැඩිදියුණු කිරීම සඳහා පුහුණු පාඨමාලාවක් දියත් කිරීම.





- පොහොර හා පොහොර භාවිතය පිළිබඳව ආයතනික අලෙවි බලකාය දැනුවත් කිරීම සඳහා පේරාදෙණිය කෘෂි විද්‍යාපීඨය හා එක්ව පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
- ''කයිසන් සංකල්පය'' පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ මුළු පැවැත්වීම.
- ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ හරිත ඵලදායිතා වැඩසටහන සඳහා සේවක භවතුන් සහභාගි කරවීම.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් පවත්වන ලද කණ්ඩායම් ක්‍රියාකාරකම් හා ඵලදායිතා කව තුළින් සේවක භවතුන්ගේ හා ආයතනික ඵලදායිතාවය පිළිබඳ වැඩ මුළු පැවැත්වීම.
- සෞඛ්‍ය ආරක්ෂිත වැඩ පරිසරයක් සැකසීම.
- ආයතන භූමිය ක්‍රමවත්ව පවත්වාගෙන යාම තුළින් සේවක භවතුන් වෙත ප්‍රසන්න ආයතනයක රැකියාව කිරීමෙන් ලැබෙන තෘප්තිය ලබා දීම.

- පොළොන්නරුව ගබඩා සංකීර්ණයේ නඩත්තු සඳහා යටිතල පහසුකම් සම්බන්ධීකරණය සඳහා කාර්මික අංශයක් ස්ථාපිත කිරීම.




- www.lakpohora.lk වෙබ් අඩවිය සංවර්ධනය කිරීම හා නව වෙබ් අඩවිය එළි දැක්වීමට කටයුතු කිරීම.




- ස්ථාවර වත්කම් පාලන මෘදුකාංගය හඳුන්වාදීම හා පවත්වාගෙන යාම.
- මානව සම්පත් කළමනාකරණ පද්ධති මෘදුකාංගයක් හඳුන්වාදීම.
- තුන්වන පාර්ශව ගෙවීම් “E Transfer”මගින් සිදු කිරීමට කටයුතු සිදුවෙමින් පවතී.
- ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා ඩයලොග් ආයතන සම්බන්ධ වෙමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි කාර්යාල හා ගබඩා පද්ධතිය එකිනෙක සම්බන්ධ කරමින් සන්නිවේදන පහසුකම් පුළුල් කිරීම. මෙමගින් පිරිවැය අවමකර ගැනීමට හැකිවීම විශේෂත්වයක් ගනී.

## සමාජ සත්කාර

- ජාතික ගොවි සතියට සමගාමීව“ලක්පොහොර පාපැදි සවාරිය” පැවැත්වීමෙන් ක්‍රීඩාවට අතහිත දීම.
- පහ වසර ශිෂ්‍යත්වයට පෙනී සිටින දූවා දරුවන් වෙනුවෙන් ආදර්ශ ප්‍රශ්න පත්‍ර කට්ටලයක් නොමිලේ ලබා දීම.
- සිසු දරුවන්ට අධ්‍යාපනික ශිෂ්‍යත්ව ලබා දීම.
- වාර්ෂිකව පොසොන් පොහොය දිනට මහා බත් දන්සැලක් පැවැත්වීම.

- "අපි වවමු - රට නගමු " වැඩසටහන යටතේ පැවැති ගෙවතු වගා තරඟ වලදී කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රාජ්‍ය අංශයේ ප්‍රථම ස්ථානය වසරින් වසර මෙම සමාගමට හිමිව ඇත.
- "දිවිනැගුම" වැඩසටහන යටතේ ආයතන භූමි පරිශ්‍රය තුළ කෘෂිකාර්මික ගොවිපොළක් ක්‍රියාත්මක කර ඇත.



# සී/ස. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

# සී/ස. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම



## දැක්ම

"කෘෂිකර්මාන්තය සඳහා භාණ්ඩ හා සේවා නොපමාව නිෂ්පාදනය කොට බෙදාහැරීම තුළින් ශ්‍රී ලාංකීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ධනාත්මකව දායකත්වය සැපයීම තුළින් රාජ්‍ය අංශය සතු ආදර්ශමත් ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වීම."

## මෙහෙවර

"ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පොහොර නිෂ්පාදකයා හා බෙදාහරින්නා බවට පත්වෙමින් රජයේ කෘෂිකර්මාන්තය සඳහා වූ දැක්මේ සාඩම්බර කොටස්කරුවකු වෙමින් නිෂ්පාදන විවිධාංගීකරණය, උසස් තත්ත්වයේ නිෂ්පාදන එළිදැක්වීම සහ ආයතනයේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා අනුව කටයුතු කරමින් ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීම සඳහා අවස්ථාව උදාකරගැනීම."

# 2012 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්

## 1. 2012 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව පොහොර ගබඩාවක් ඉදිකිරීම.



2012 වර්ෂයේ පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලය - සීප්පුකුලම ග්‍රාමයේ වර්ග අඩි 7,200ක ඉඩ ප්‍රමාණයකින් යුත් මෙ.ටො. 2,500ක ගබඩා ධාරිතාවයකින් යුත් ගබඩාවක් රු.මි. 13.5ක් වැයකොට ඉදිකරන ලද අතර 2012 අප්‍රේල් 09 දින විවෘත කරන ලදී.

## 2. පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම.

ආයතනයේ පරිපාලන කටයුතු නිසි පරිදි කරගෙනයාමට පරිපාලන ගොඩනැගිල්ලක දැඩි අවශ්‍යතාවය ආයතනය 1994 පෞද්ගලිකරණයෙන් පසුව නැවත 1996 රජයට පවරාගැනීමෙන් පසුව පැවති අතර එයට විසඳුමක් වශයෙන් වර්ග අඩි 10,000කින් සමන්විත වන රු.මි. 44ක වියදමින් දෙමහල් පරිපාලන සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු 2012 වසරේ ආරම්භ කරන ලද අතර 2013 අප්‍රේල් මාසය වන විට එහි වැඩකටයුතු අවසන් කිරීමට නියමිතය. මේ සඳහා අවශ්‍ය අරමුදල් ආයතනයේ ව්‍යාපාර කටයුතු වලින් උපයාගන්නා ලදී.

## 3. පොහොර ගබඩාවක් ඉදිකිරීම.



පොහොර අවශ්‍යතාවයෙන් 35% ප්‍රමාණයක් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත සපයාදීමේදී ආයතනය සතු ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීමද ආයතනය දැනට මුහුණ පා ඇති ප්‍රධාන අභියෝගයකි. ඊට පිළියමක් වශයෙන් වර්ග අඩි 22,000 සමන්විත පොහොර මෙ.ටො. 8000ක ගබඩා ධාරිතාවයකින් යුතු රු.මි.61ක ඇස්තමේන්තුගත වියදමකින් හුණුපිටිය ප්‍රධාන ගබඩා සංකීර්ණය පිහිටි භූමියට ආසන්නව නව ගබඩාවක් ඉදිකිරීම සඳහා භූමිය සකස්කොට අවසන් අතර මේ වන විට සුදුසු ඉදිකිරීම් ආයතනයක් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමේ කටයුතු සිදුකොට තිබේ. මේ සඳහා අරමුදල් කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින්ම උපයා ගන්නා ලද අරමුදල වීම විශේෂත්වයකි.

## 2012 සහනාධාර පොහොර බෙදා හැරීම - 2012.12.31 දිනට ප්‍රගතිය

මහින්ද චින්තන වැඩසටහන යටතේ පහත සඳහන් පොහොර ප්‍රමාණයන් ඒ ඒ දිස්ත්‍රික්ක වල කි.ග්‍රෑ. 50 පොහොර මිටිය රු. 350/- බැගින් සහන මිලට ගොවි ජනතාව අතර බෙදා හරින ලදී.

| දිස්ත්‍රික්කය | පොහොර වර්ගය (මෙ. ටො.) | | | එකතුව (මෙ. ටො.) | විකුණුම් ආදායම (රු.) |
|---|---|---|---|---|---|
| | යූරියා | ටී. එස්. පී. | එම්. ඕ. පී. | | |
| කොළඹ | 222.45 | 99.05 | 180.40 | 501.90 | 3,151,932.00 |
| ගම්පහ | 1,036.05 | 477.40 | 470.80 | 1,984.25 | 12,461,090.00 |
| කළුතර | 933.00 | 484.35 | 795.05 | 2,212.40 | 13,893,872.00 |
| මහනුවර | 365.15 | 171.80 | 140.45 | 677.40 | 4,254,072.00 |
| මාතලේ | 1,922.85 | 612.85 | 508.90 | 3,044.60 | 19,120,088.00 |
| නුවරඑළිය | 243.15 | 117.60 | 119.65 | 480.40 | 3,016,912.00 |
| ගාල්ල | 700.30 | 327.05 | 589.80 | 1,617.15 | 10,155,702.00 |
| මාතර | 1,344.35 | 568.60 | 857.55 | 2,770.50 | 17,398,740.00 |
| හම්බන්තොට | 5,619.40 | 1,885.20 | 1,583.15 | 9,087.75 | 57,071,070.00 |
| කුරුණෑගල | 8,522.00 | 2,678.70 | 2,337.65 | 13,538.35 | 85,020,838.00 |
| පුත්තලම | 2,247.50 | 708.90 | 612.65 | 3,569.05 | 22,413,634.00 |
| රත්නපුරය | 1,460.20 | 487.80 | 489.45 | 2,437.45 | 15,307,186.00 |
| කෑගල්ල | 189.95 | 84.55 | 88.55 | 363.05 | 2,279,954.00 |
| බදුල්ල | 2,967.20 | 1,128.60 | 913.80 | 5,009.60 | 31,460,288.00 |
| මොණරාගල | 4,161.90 | 1,327.75 | 1,122.05 | 6,611.70 | 41,521,476.00 |
| අනුරාධපුරය | 14,121.90 | 4,649.35 | 3,838.45 | 22,609.00 | 141,984,520.00 |
| පොළොන්නරුව | 6,395.30 | 2,111.80 | 1,782.20 | 10,289.30 | 64,616,804.00 |
| මඩකලපුව | 3,097.70 | 1,080.45 | 834.25 | 5,012.40 | 31,477,872.00 |
| අම්පාර | 14,062.70 | 4,644.00 | 3,698.90 | 22,405.60 | 140,707,168.00 |
| ත්‍රිකුණාමලය | 4,808.40 | 1,566.05 | 1,199.60 | 7,574.05 | 47,565,034.00 |
| වවුනියාව | 1,750.00 | 562.50 | 418.75 | 2,731.25 | 17,152,250.00 |
| මුලතිව් | 1,285.20 | 412.35 | 364.70 | 2,062.25 | 12,950,930.00 |
| මන්නාරම | 2,493.05 | 773.65 | 693.00 | 3,959.70 | 24,866,916.00 |
| කිලිනොච්චි | 1,883.75 | 512.00 | 461.50 | 2,857.25 | 17,943,530.00 |
| **එකතුව** | **81,832.75** | **27,472.35** | **24,101.25** | **133,406.35** | **837,791,878.00** |

## 2012/13 ඉලක්කය - යල/මහ
## සහනාධාර පොහොර බෙදාහැරීම

සී/ස. කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ 2012/13 යල/මහ කන්නයේ පහත පරිදි පොහොර ආනයනය කොට බෙදා හැරීම සඳහා අපේක්ෂා කරනු ලබයි.

| | |
|---|---|
| යූරියා (මෙ.ටො.) | 135,088 |
| ටී.එස්.පී. (මෙ.ටො.) | 34,530 |
| එම්.ඕ.පී. (මෙ.ටො.) | 30,997 |

# සී/ස. ජනතා පොහොර ව්‍යවසාය

# සී/ස. ජනතා පොහොර ව්‍යවසාය

1987 පොදු ව්‍යාපාර පවරා ගැනීමේ පනත යටතේ සංස්ථාපිත කරන ලද මෙම ආයතනය 1991 පෙබරවාරි මස 08 වන දින අංක 649 දරණ ගැසට් පත්‍රය මඟින් සමාගමක් බවට ස්ථාපිත කරන ලදී. 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 2009.11.03 දින නැවත ලියාපදිංචි කරන ලදී.

සී/ස. ජනතා පොහොර ව්‍යවසාය භූමිය සම්පූර්ණයෙන්ම පොහොර අංශය විසින් පොහොර මිශ්‍ර කිරීම හා අලෙවිය සඳහා භාවිතා කරන ලදී. ඉහත කී පැවරීමේ කටයුතු ප්‍රසිද්ධ සමාගම් ආඥා පනතේ අංක 3(1) සහ 3(2) යටතේ චංචල හා නිශ්චල සියළුම දේපල සහිත ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් මෙකී භූමිය, 1991 පෙබරවාරි මස 08 දින සිට සී/ස. ජනතා පොහොර ව්‍යවසායට පොහොර මිශ්‍ර කිරීම හා අලෙවිය සඳහා පවරා දීමට කටයුතු කර ඇත. ඉන් අනතුරුව කාබනික පොහොර නිෂ්පාදන කටයුතු වල නියැළී කටයුතු කළ අතර 2011 අගෝස්තු මස සිට ව්‍යාපාර කටයුතු නවතා ඇත.

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/1344/549/003-IV අනුව 2012.10.03 වන දින අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ සී/ස. ජනතා පොහොර ව්‍යවසාය ස්වේච්ඡාවෙන් ඈවර කිරීමට තීරණය කර ඇත.

# ශ්‍රී ලංකා වනජීවී භාරය

# වනජීවී භාරය

## අරමුණු

- ශ්‍රී ලංකාවේ ස්වාභාවික උරුමයන්හි පාරිසරික හා ආර්ථික අගයන් ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම
- වනජීවී හා පාරිසරික අධ්‍යාපනික කටයුතු ප්‍රචලිත කිරීම
- ශ්‍රී ලංකාවේ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා සහාය වීම
- සංරක්ෂිත කලාප ආශ්‍රිතව ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පියවර ගැනීම
- වනජීවී/ පාරිසරික නීති අවශ්‍ය පරිදි ප්‍රචලිත කිරීම
- පාරිසරික සංචාරක පහසුකම්, සන්නිවේදන කාර්යභාරයන් පවත්වාගෙන යාම හා සංවිධානය කිරීම
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සංස්කෘතික අගයන් පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර අවබෝධය වැඩිදියුණු කිරීම

## පරිපාලනය

වනජීවී භාරය පාලනය කරනු ලබන්නේ සාමාජිකයන් 10 දෙනෙකුගෙන් යුත් භාරකාර මණ්ඩලයක් මගිනි. මෙහි සංයුතිය වනුයේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නිල වශයෙන් සභාපති වශයෙන්ද, වනජීවී විෂය භාර අමාත්‍යාංශ ලේකම්තුමා, වන සංරක්ෂණ ජනරාල්, මුදල් අමාත්‍යාංශ නියෝජිත, ලංකා සංචාරක මණ්ඩල නියෝජිත, මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිත, රාජ්‍ය නොවන ආයතන නියෝජිතයන් දෙදෙනෙකු හා පෞද්ගලික ව්‍යාපාරික අංශයෙන් දෙදෙනෙකු වශයෙනි.

### වනජීවී භාරයේ ආදායම් මාර්ග

වනජීවී භාරය සිය සියලු කාර්යයන් සඳහා ආදායම් ඉපයීම කළ යුතු වේ. මේ සඳහා දැනට ප්‍රධාන ආදයම් මාර්ග 4ක් හඳුනාගෙන ඇත.

- අරමුදල් ආයෝජනය
- රන්දෙණිගල පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් කුලියට දීම
- පාරිසරික සංචාරක කටයුතු
- අලෙවි කටයුතු (සන්නිවේදන භාණ්ඩ ආදිය)

සංරක්ෂණ සේවාවන් වර්ධනය කිරීම වනජීවී භාරයෙහි වාර්ෂික ආදායම් වර්ධනය සමග බැඳී පවතී.

### වනජීවී භාරයේ වැඩසටහන් හා සේවාවන්

වනජීවී භාරය තම වාර්ෂික ආදායමෙන් 50%ක් පමණ විවිධ වූ සංරක්ෂණ සේවාවන් පවත්වාගෙන යාම සඳහා වැය කරනු ලබයි. පහත සඳහන් සේවාවන් ප්‍රධාන වේ.

- **ප්‍රජා අධ්‍යාපන වැඩසටහන්**

  මේ යටතේ ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, ගවේෂණ චාරිකා, එක්දින දැනුවත් කිරීමේ වැඩමුළු, තෙදින නේවාසික ගවේෂණ චාරිකා හා සයමාසික වනජීවී සංරක්ෂණ සහතික පත්‍ර පාඨමාලා ආදිය ඇතුළත් වේ. මෙයට අමතරව විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ද වනජීවී භාරය මගින් සංවිධානය කෙරේ.

- **පාසල් අධ්‍යාපනික වැඩසටහන් හා පාරිසරික කටයුතු**

  මෙම වැඩසටහන වනජීවී භාරයෙහි ප්‍රමුඛ වැඩසටහනකි. ඉතා වැදගත් ජෛව විවිධත්ව වටිනාකමකින් යුත් වනජීවී කලාප ආශ්‍රිත පාසල් සඳහා මෙහිදී ප්‍රමුඛත්වය ලබා දී ඇත. වනජීවී කලාප අවට ඇති පාසල්වල ක්‍රියාකාරී ගුරුවරුන් හා සිසුන් කණ්ඩායම් ඒකරාශී කරමින් ඔවුන්ගේ මූලික සහභාගීත්වය හා සැලසුම් කිරීම් යටතේ කෙටිකාලීන ක්‍රියාවෙන් ඉගෙනීමේ සැලසුම් හරහා මෙම වැඩසටහන් සංවිධානය කරනු ලබයි.

- **ප්‍රජා සංවිධාන ශක්තීන් දියුණු කිරීම**

  වනජීවී ආරක්ෂිත කලාප තුළ හා අවට ප්‍රජාවගේ සංවර්ධන ක්‍රියාවලිය අරමුණු කරගත් සමාජානුයෝජනය දියුණු කිරීම මෙම ක්‍රියාකාරකම් වලට ඇතුළත් වේ.

- **පර්යේෂණ කටයුතු**

  (ප්‍රායෝගික නැඹුරුවක් සහිත) මේ යටතේ අදාළ ක්ෂේත්‍රයන් තුළ විවිධ මට්ටමේ පර්යේෂණ කටයුතු සඳහා සහය ලබාදීම. විශේෂයෙන්ම විශ්ව විද්‍යාල මට්ටමේ උපාධි අපේක්ෂක, පශ්චාත් උපාධි අපේක්ෂක, පර්යේෂණ කටයුතු සඳහා සහය වීම හා උසස් පෙළ සිසුන් සඳහා ව්‍යාපෘති කටයුතු වලට සහය වීම සිදු කෙරේ.

- **සන්නිවේදන හා ප්‍රවෘත්ති අංශ ව්‍යාපෘතිය**

  වනජීවී භාරයෙහි අලෙවිසැල්හි ප්‍රකාශන කාර්යාංශය, ප්‍රදර්ශන අංශය හා සම්බන්ධ කාර්යාංශයන් මීට ඇතුළත් වේ. දැනට වනජීවී භාරය මගින් තොරතුරු සන්නිවේදනය හා අලෙවි මධ්‍යස්ථාන 7 ක් ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

## 2012 වර්ෂයේ ආදායම

| ආයතනය | මුදල (රු.) |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 301,020.00 |
| රන්දෙණිගල අ.ප.අ.ව කේන්ද්‍රයය | 390,917.00 |
| යාල ජාතික උද්‍යානය | 915,275.00 |
| ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය | 16,475.00 |
| මධ්‍යම පරිසර අධිකාරිය | 75,478.00 |
| උඩවලව ඇත් අතුරු සෙවන | 86,695.00 |
| විල්පත්තු ජාතික උද්‍යානය | 147,535.00 |